# ලංකාවේ දිගම බතික් රෙද්ද



බතික් නිර්මාණ ශිල්පිනියක් වන දේශානි විජේසිංහ විසින් අඩි 90ක් දිගැති ලංකාවේ මෙතෙක් නිර්මාණය කළ දිගම බතික් රෙද්ද කොළඹ වන් ගෝල්ෆේස්හි ප්‍රදර්ශනය කර තිබූ අයුරු.

ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

අරුණ

2023 ජූලි 3 සඳුදා | හතර වැනි කාණ්ඩය | 235 කලාපය | මිල රු 60.00 | www.aruna.lk



# රිච්ටර් පරිමාණ 8ක ලොකු භූ කම්පනයකදී කොළඹ බිල්ඩින් බිම

## මහල් ගොඩනැගිලි රැසක් අබලන් තත්ත්වයේ

■ සාලිය කුමාර ගුණසේකර

මෙරට මුහුදු කලාපය ආශ්‍රිතව රිච්ටර් පරිමාණ අටක (8) භූ කම්පනයක් සිදුවුවහොත්, කොළඹ නගරයේ අස්ථාවර පාදම් සහිත උස් ගොඩනැගිලිවලට අවදානම් තත්ත්වයක් උද්ගත වියහැකි බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න පැවසුවේය.

02 පිටුවට

# අරක්කු ගණන් උස්සයි


## බීඩියත් නැගලා

■ උදයජීව ඒකනායක/සාලිය කුමාර ගුණසේකර

සියලුම වර්ගයේ මත්පැන් බෝතලයක මිල රුපියල් 300ත් 400 ත් අතර මිලකින් ඉහළ දමා ඇතැයි මත්පැන් නිෂ්පාදන සමාගම් නියෝජිතයෝ සඳහන් කරති. බීඩියක් රුපියල් පහකින්ද,දුම්වැටියක් රුපියල් 15 ත් 25 ත් අතර මිලකින්ද වැඩිකර තිබේ.

02 පිටුවට

# ඇන්ටික් වාහනවලට ආණ්ඩුවෙන් තල්ලුවක්



■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

ලියාපදිංචිය සඳහා විශාල දඩ මුදලක් ගෙවීමට සිදුවන නිසා භාවිත නොකරන පෞරාණික වටිනාකමකින් යුත් වාහන (Antique) වලට කැබිනට් අනුමැතියකින් සහනයක් ලබා දී ගමනාගමනයට ඉඩ ලබාදීමට රජය තීරණය කර ඇත. විශාල දඩ මුදලක් ගෙවීමට සිදුවන නිසා වසර ගණනක් තිස්සේ ලියාපදිංචි නොකළ වාහන විශාල සංඛ්‍යාවක් නිවෙස් තුළම රඳවා ගෙන සිටින බව අනාවරණය වී ඇත.

02 පිටුවට

# ත්‍රිපිටකය දමිළ බසින්



■ වරුණි පෙරමුණ

ත්‍රිපිටකය දමිළ භාෂාව ඇතුළු භාෂා කිහිපයකට පරිවර්තනය කිරීමට කටයුතු කරන බව බුද්ධ ශාසන සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය පවසයි.

02 පිටුවට

# පරාට-කොත්තු කා ගායකයා බයිලා නටලා

## බිල ගෙවන්න බෑ කියා පුටු උඩින් යවලා



සිද්ධිය ඇති වූ අවස්ථාව

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

ජනප්‍රිය ගායක සමන් ද සිල්වා පෙරේද (01 වැනිද) රාත්‍රී පිරිසක් සමග පානදුර පාලම අසල ආපන ශාලාවක ආහාර ගැනීමෙන් අනතුරුව ඇති වූ බහින් බස් වීමකින් එහි සේවකයන් දෙදෙනකුට පහර දී දේපළවලට ද අලාභානි සිදුකළ බව පවසමින් පැමිණිල්ලක් ලැබී ඇතැයි පානදුර දකුණ පොලිසිය කියයි.

02 පිටුවට

# වත්ත බද්දට දී ලංගම ඇස්සට දත නියවයි

■ නිලන්ත මදුරාවල

රුපියල් කෝටි එක්දහස් විසි පහකට තක්සේරු කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් කොළඹ ඉඩම් කට්ටි දහතුනක් මීට වසර හතකට පෙර පවරා දුන් පෞද්ගලික සමාගම මේ වන විට වසා දමා තිබීම නිසා එම ඉඩම් යළි පවරා ගැනීම බරපතළ අර්බුදයක් බවට පත්ව තිබේ.

02 පිටුවට

# උස්සන වාහන මස්කර විකුණන කල්ලිය ගුගල්වලින් අල්ලයි

03 පිටුවට

# මාංචු දැමූ සැකකරු 5 මහලින් පැන මරුට

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග මත රඳවාගෙන සිටි සැකකරුවකු කොටහේන බ්ලූමැන්ඩල් වී.ටී.වී. මහල් නිවාස සංකීර්ණයේ පස්වන මහලින් අත්විලංගු සමග බිමට පැනීමෙන් මියගොස් ඇතැයි කොටහේන පොලිසිය කියයි.

02 පිටුවට




# පේරාදෙණිය සරසවිය බලා හාලත් ගිහින්

05 පිටුවට



# ගොවියට සජිත් සූත්‍රයක් ඉල්ලයි



■ ඒ. ඒ.පේමසිරි - තිස්සමහාරාම

පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්නා ලද මිල සූත්‍රයක් හරහා මෙරටේ ගොවියාටත්, පාරිභෝගිකයාටත් සාධාරණය ඉෂ්ඨ විය යුතු බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස පැවසීය.

02 පිටුවට

# කරමලය කළු කුකුළෙක් බිල්ලට දී වලගම්බා රජුගේ ඔටුන්න හොයලා

07 පිටුවට



# විදුලි ගාස්තු සංශෝධනයට කොමිසමෙන් කොන්දේසි 11ක්

■ අශිකා ජයවීර

මෙම මස පළමුවැනිද සිට ක්‍රියාත්මක විදුලි ගාස්තු සංශෝධනයට අදාළව ලංකා විදුලි මණ්ඩලයට සහ ලංකා විදුලි පුද්ගලික සමාගමට මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කොන්දේසි 11 ක් පනවා ඇත.

02 පිටුවට

පුවත්පත

නිවසටම ගෙන්වා ගැනීමට

දැන්ම අමතන්න : 0761 367 623

නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න

# සමුපකාර-ආණ්ඩු දීගේ හමාරයි

■ චාමර පල්ලේගෙදර

සමුපකාර ව්‍යාපාරය පාලනය සඳහා රජයේ යම් හෝ දයකත්වයක් දැක්වූවේද ඉන් සම්පූර්ණයෙන්ම ඉවත් වීමට පියවර ගන්නා බව වෙළෙඳ ඇමැති නලීන් ප්‍රනාන්දු පැවසීය.

1997 වසරේ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණියගේ සංකල්පයකට ආරම්භ කළ සමුපකාර ව්‍යාපාරය සියයට සියයක්ම ඔවුන්ගේම සංවිධාන ව්‍යුහයකින් ගොඩනගා ගත් එකක් බවත් එම නිසා ඒ සඳහා රජයේ මැදිහත් වීමක් අවශ්‍ය නොවන බවත් ඇමැතිවරයා සඳහන් කළේය.

02 පිටුවට

## 01 වැනි පිටුවෙන්...

## ඇන්ටික් වාහනවලට...

එබැවින් එම වාහන සහන වාර්ෂික මුදලකට යටත්ව ලියාපදිංචි කොට භාවිතයට අවසර දීම සඳහා කැබිනට් අනුමැතිය ලබාදීමට නියමිතය.

මේ යටතේ සහන ක්‍රමවේදයකට ආදයම් බලපත්‍ර ලබාදීමටද නිර්දේශ කර ඇතැයි මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් නිශාන්ත වීරසිංහ අරුණට පැවැසීය.

## අරක්කු ගණන් උස්සයි...

රජය විසින් සියලුම වර්ගයේ සුරා බදු අනුපාතිකයන් ඉහළ දැමීම නිසා මෙලෙස මත්පැන් මිල ගණන් පෙරේද (01 වැනිද) රාත්‍රියේ සිට ඉහළ දැමූ බවද ඔවුහු පවසති. කෙසේ නමුත්, ඇතැම් මිලි ලීටර් 180 මත්පැන් කාලේ බෝතලය රුපියල් 100කට වැඩි මිලකින් වැඩිවී තිබේ. මත්පැන්වලට අමතරව බ්‍රැන්ඩි බෝතලයක් රුපියල් 440 කින්ද, රම් බෝතලයක් රුපියල් 518 කින්ද, වොඩ්කා බෝතලයක් රුපියල් 420 කින්ද, ජින් බෝතලයක් රුපියල් 460 කින්ද වැඩිවී ඇත.

## විදුලි ගාස්තු සංශෝධනයට...

සහාධිපත්‍ය දේපළ (නිවාස සංකීර්ණවල) පාරිභෝගිකයන්ට අදාළ වන ගාස්තු කාණ්ඩයට යටත් කර ගාස්තු අයකිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) හා ලංකා විදුලි පුද්ගලික සමාගම (ලෙකෝ) කඩිනමින් පියවර ගත යුතු වීම,

වීථි ලාම්පු සඳහා පරිභෝජනය කෙරෙන විදුලිය ඇස්තමේන්තු කර බිල්පත් නිකුත් කර අදාළ පළාත් පාලන ආයතන මාර්ග සංවර්ධන අධිකාරියෙන් අදාළ ගාස්තු අයකර ගැනීම සඳහා පියවර ගත යුතුවීම,

පාරිභෝගිකයන්ගෙන් ලබාගත් ඇප තැන්පතු ආයෝජනය කර ඉන් ලැබෙන ප්‍රතිලාභවලින් පාරිභෝගිකයන්ට පොලිය ගෙවීමට පියවර ගත යුතු වීම,

පාරිභෝගික ඇප තැන්පතු සඳහා ගෙවන පොලිය අදාළ පාරිභෝගිකයාගේ මාසික බිල්පතෙන් අඩු කර ගැනීම සඳහා පියවර ගත යුතු වීම,

ඉන්ධන හා ගල් අඟුරු සැපයීම්වලට අදාළව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ගල් අඟුරු සමාගම සමග ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට ලංවිම පියවර ගත යුතු වීම,

ලංවිම විදුලි බලාගාර සහ ලංවිම සම්ප්‍රේෂණ අංශය අතර විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ක්‍රියාවට නැගිය යුතු අතර ලංවිම සම්ප්‍රේෂණ අංශය හා බෙදාහැරීම් අංශ අතර විදුලිය අලෙවිය සඳහා ගිවිසුම් ක්‍රියාවට නැගිය යුතු වීම,

දැනට බලපත්‍ර රහිතව ක්‍රියාත්මක ලංවිම බලාගාර සඳහා මාස 2ක් ඇතුළත බලපත්‍ර ලබාගත යුතු ය,

පුනර්ජනනීය විදුලි බලාගාර (වහල මත සවිකරන සූර්ය බලාගාර ද ඇතුළුව) වලින් විදුලිය මිලදී ගැනීමේදී කළ යුතු ගෙවීම් කඩිනමින් ගෙවීමට පියවර ගත යුතු ය,

මෙම තීන්දුවේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත ලංවිම විසින් තොග සැපයුම් සම්ප්‍රේෂණ ගිණුම ක්‍රියාවට නැගිය යුතු ය,

නෙට් මීටරින් සහ නෙට් එකවුන්ටින් ක්‍රම යටතේ වහල මත සවිකල සූර්ය බල පද්ධති සහිත විදුලි පාරිභෝගිකයන්ගෙන් මාසික ස්ථාවර ගාස්තු අයකිරීමේ දී ඔවුන් විසින් ආනයනය කළ ශුද්ධ විදුලි ප්‍රමාණය මත මාසික ගාස්තුව අය කළ යුතු ය. (ඔවුන් විසින් ශුද්ධ අපනයනයක් කර ඇත්නම් මාසික ගාස්තුව තීරණය කළ යුත්තේ මාසික විදුලි පරිභෝජනය 0 ලෙස පදනම් කරගෙන ය.)

ආගමික ස්ථාන සඳහා වහල මත සවිකරන සූර්ය බල පද්ධති සවිකිරීමේ ක්‍රියාදාමය ලංවිම සහ ලෙකෝ විසින් කඩිනම් කළ යුතු අතර එහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් මෙම තීන්දුවේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යන එම කොන්දේසි වන්නේය.

## මාංචු දැමූ සැකකරු ...


මෙලෙස මියගොස් ඇත්තේ කොළඹ 5 ශ්‍රී සිද්ධාර්ථ පාර පදිංචිව සිටි සත්‍යා අගිලන් නමැති තිස් එක් හැවිරිදි පුද්ගලයෙකි.

මිය ගිය සැකකරු ඉකුත් 29 වැනි දින වෙරළබඩ පොලිස්ස්ථානය මගින් හෙරොයින් මත්කුඩු මිලිග්‍රෑම් 5010ක් සමග අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන කටයුතු සඳහා කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වෙත භාරදී තිබියදී මෙම අනතුර වී ඇත. සැකකරු අත් විලංගු සහිතව එම මහල් නිවාස සංකීර්ණයේ පස්වන මහලේ කොරිඩෝව හරහා රැගෙන යමින් සිටියදී බිමට පැන ඇති බව පොලිසිය කියයි.

වහා ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන් සැකකරු කොළඹ ජාතික රෝහල වෙත රැගෙන ගොස් ඇති අතර දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

## ත්‍රිපිටකය ...

බුද්ධ ශාසන සහ සංස්කෘතික කටයුතු ඇමැති විදුර වික්‍රමනායක ප්‍රකාශ කළේ බෞද්ධ දර්ශනය පිළිබඳව හැදෑරීමට කැමැත්තෙන් සිටින දෙස් විදෙස් පිරිසගේ ඉල්ලීම මත මෙසේ ත්‍රිපිටකය දමිළ භාෂාව ඇතුළු ප්‍රධාන භාෂා කිහිපයකට පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වන බවය. එසේ පරිවර්තනය කිරීමේදී එම ග්‍රන්ථයේ අදහස්වලට කිසිදු හානියක් නොවන ආකාරයෙන් පරිවර්තනය කිරීම සිදුකරන බවද ඇමතිවරයා පැවැසීය.




# ඊශ්‍රායලය සහ ශ්‍රී ලංකාව අතර සෘජු මගී ගුවන් සේවා ඔක්තෝබරයේ සිට

ඊශ්‍රායලය සහ ශ්‍රී ලංකාව අතර ලබන ඔක්තෝබර් මාසයේ සිට සෘජු මගී ගුවන් සේවා ආරම්භ කරන බව වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය පවසයි.



ඒ අනුව ඊශ්‍රායලයේ තෙල්අවිව් නුවර සිට කටුනායක ගුවන් තොටුපළ දක්වා ප්‍රථම වරට සෘජු මගී ගුවන් සේවා ආරම්භ කිරීමට නියමිතය .

නව ගුවන් සේවාව ආරම්භ කිරීම පිළිබඳව පවතින ගැටලු නිරාකරණය කරගනිමින් එකඟතාවයක් සඳහා පැමිණීමට දෙරටේ සිවිල් ගුවන්සේවා අංශ දීර්ඝ වශයෙන් වරාය නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී සාකච්ඡා කරන ලදී .

ඊට අදාළ අවබෝධතා ගිවිසුමට ඉදිරියේදී අත්සන් තැබීමට නියමිතය.

ඊශ්‍රායලයෙන් පැමිණි ගුවන් සේවා අංශයේ නියෝජිතයින් විශේෂයෙන් වැඩි අවධානයක් යොමුකරන ලද්දේ ගුවන් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමේදී කටුනායක ගුවන් තොටුපළ සහ අවට පරිශ්‍රයේ පවතින ආරක්ෂක තත්ත්වයන් පිළිබඳවය.

මෙහිදී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ ගුවන්සේවා මෙහෙයුම්වලදී සිදුකරනු ලබන ආරක්ෂක වැඩපිළිවෙළ පිළිබඳව පූර්ණ පැහැදිලි කිරීමක් සිදුකරන ලදී.

අනතුරුව ඊශ්‍රායල් නියෝජිතයන් එම ආරක්ෂක වැඩපිළිවෙළ පිළිබඳව පැහැදීමට පත්ව ඇති බව වාර්තා වේ.

ඒ අනුව දෙරටේ සිවිල් ගුවන් සේවා අංශ අතර අවබෝධතා ගිවිසුමක් නුදුරේදී අත්සන් කිරීමට නියමිතය ලබන ඔක්තෝබර් මස සිට ඊශ්‍රායලයේ "ආකියා" (Arkia) ගුවන් සේවයට අයත් ගුවන්යානා ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත බවත් සිවිල් ගුවන් සේවා අධිකාරිය පැවසීය .

මෙම සෘජු ගුවන් සේවාව මගින් ඔවුන්ට විශාල පහසුවක් මෙන්ම ගුවන් ටිකට් පත්‍ර මිල දී ගැනීමේදී මූල්‍යමය ලාභයක් ලැබෙන බවත් ඇමැතිවරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේය .

## පරාට-කොත්තු කා ...

සමන් ද සිල්වා ඇතුළු පස් දෙනකුගෙන් යුත් පිරිස එම ආපන ශාලාවට රාත්‍රි 11.20 ට පමණ පැමිණ පරාටා සහ කොත්තු ආහාරයට ගැනීමෙන් අනතුරුව එහි බිල නොගෙවා පිටව යාමට සැරසීමත් සමගම සේවකයන් එයට විරුද්ධ වී තිබූ බව පොලිසිය කියයි.

එම අවස්ථාවේදී සමන් ද සිල්වා මහතා "උඹලා දන්නැද්ද යකෝ මම සමන් ද සිල්වා කියලා" යනුවෙන් ආවේගශීලීව හැසිරී ඇති බවත් ඔහු සමග සිටි පිරිස වේටර්වරයකුට සහ මුදල් අයකැමිවරයාට පහරදී අනතුරුව ප්ලාස්ටික් පුටු හෝටලයේහිමිකරුට සහ සේවකයන්ට පහර දී විකිණීමට තිබූ වතුර බෝතල් රැසකට අලාභහානි සිදුකර තිබූ බවත් එම පැමිණිල්ලේ සඳහන් වේ.

සමන් ද සිල්වා ඇතුළු පිරිස පරාටා විස්සක්, උම්බලකඩ සම්බෝලයක්, කුකුළු මස්, කිරි හා පරිප්පු ආහාරයට ගෙන ඇති අතර පැණි බීම බෝතල් දෙකක්ද පානය කර තිබූ බව එම පැමිණිල්ලේ සඳහන් වේ.

ඒ සඳහා රුපියල් 1650 බිල ගෙවන ලෙස දැනුම් දී ඇති අතර සමන් ද සිල්වා ඇතුළු පිරිසක් ආපනශාලාවේ ඉදිරිපිටට ගොස් නැවත පැමිණ ආපන ශාලාවේ හිමිකරු සහ සේවකයන් සමග බහින්බස් වී සේවකයන්ට පහර දී දේපළවලට අලාභ හානි සිදුකර ඇතැයි පැවසේ.

එම පහර දීමෙන් සේවකයන් දෙදෙනකුට සුළු තුවාල සිදු වී ඇති අතර ප්ලාස්ටික් පුටු හතරකට සහ විශාල ප්‍රමාණයේ වතුර බෝතල් 12කට අලාභ සිදු වී ඇතැයි හිමිකරු පවසයි.

සිද්ධියට මුහුණ පෑ මුදල් අයකැමිවරයා සහ වේටර්වරයා ඒ සම්බන්ධයෙන් පානදුර දකුණු පොලිසියට පෙරේද (1) රාත්‍රියේම පැමිණිල්ලක් කර ඇත.

සමන් ද සිල්වා ඇතුළු පිරිස ආවේගශීලීව හැසිරෙන අයුරු එහි සේවකයකු සිය ජංගම දුරකතනයෙන් වීඩියෝ කර තිබිණි.

පානදුර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සමන්ත වෙදගේ සහකාර පොලිස් අධිකාරී නිශාන්ත සේනාරත්නගේ උපදෙස් මත පානදුර දකුණ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල් ප්‍රියංකර නාඋල්ල ගේ ප්‍රධානත්වයෙන් පරීක්ෂණ පැවැත්වේ.

## සමුපකාර-ආණ්ඩු...

සෑම රජයක්ම මෙම ව්‍යාපාරය සඳහා මැදිහත් වීම හරහා එම ව්‍යාපාරයේ දියුණුවට බලපෑමක් වූයේ යැයි සණස ව්‍යාපාරයේ නිර්මාතෘ ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය ප්‍රකාශ කළ බවත් එම නිසා රජයෙන් එවැනි බලපෑම් වන්නේ නම් රජය එහි පාලනයෙන් ඉවත් වන බවත් හෙතෙම කීවේය.

එහෙත් සමුපකාර ව්‍යාපාරය රජය සතු නොවූවත් නියාමනය සඳහා රජය විසින් සමුපකාර කොමසාරිස්වරුන් පත් කර ඇත.

එම නිසා මින් ඉදිරියට ඔවුන්ට සහය දැක්වීමක් පමණක් සිදු කර ගන්නා වූ තීන්දු තීරණ ඔවුන් විසින්ම ගැනීමට ඉඩ සලසන බවත් සාකච්ඡා දෙපාර්ශවය විසින් සිදු කර තීරණයකට එළඹෙන බවත් ඇමැතිවරයා සඳහන් කළේය.




## වත්ත බද්දට දී...

මෙම ඉඩම් එම පෞද්ගලික සමාගමට පවරා ඇත්තේ මණ්ඩලයේ සේවකයන්ගේ වසර පහක හිඟ අර්ථ සාධක අරමුදල් ගෙවීමට මුදල් ලබා ගැනීම සඳහා වන නමුත් ඉඩම් පැවරීමෙන් පසු එම සමාගම කිසිදු මුදලක් මණ්ඩලයට ලබාදී නැත. ඉකුත් දෙදහස් දහයත් දෙදහස් පහළොවත් අතර කාලය සඳහා අර්ථසාධක අරමුදලට ගෙවීමට තිබූ හිඟ දයක මුදල රුපියල් කෝටි අටසිය හැට පහකි. එවකට ප්‍රවාහන ඇමැතිවරයා වූ නිමල් සිරිපාලද සිල්වා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවකට අනුව ඒ සඳහා කැබිනට් අනුමැතියද ලැබී තිබේ.

ඉඩම් පවරා සේවක අර්ථසාධක අරමුදල් වෙනුවෙන් හිලව් කිරීම සඳහා ද කැබිනට් අනුමැතිය ලැබී තිබූ නමුත් ඉඩම් පවරා ගැනීමෙන් පසු එම සමාගම වසා දමන තෙක් කිසිදු මුදලක් අරමුදලට බැර කර නැත.

වේරහැර මධ්‍යම වැඩපොළට අයත්ව තිබූ ශ්‍රී ලංකා යුද හමුදාවේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිහිටි ඉඩම්, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පිහිටි ඉඩම, මොරටුව රියදුරු අභ්‍යාස විද්‍යාලය පිහිටි ඉඩම සහ පිළියන්දල බස් නැවතුම්පොළ පිහිටි ඉඩම එසේ පවරා දී තිබෙන ඉඩම් අතර වෙයි.

මීට අමතරව මහරගම, කැස්බෑව, මොරටුව, හා කටුබැද්ද බස් රථ ඩිපෝ සහ හෝමාගම ඩිපෝව පිහිටි ඉඩමද මෙලෙස පවරනු ලැබ ඇත.

ඉඩම් පැවරීම සඳහා දෙදහස් දහසය වසරේ ජුනි මස හත් වැනිද කැබිනට් අනුමැතිය ලැබී තිබෙන අතර ඉන් මාස පහකට පසු සමාගම වසා දමා තිබේ.

ගමනාගමන මණ්ඩලයේ මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය පිළියන්දල, කැස්බෑව, හෝමාගම, මහරගම, මොරටුව, හා කටුබැද්ද යන ඩිපෝවලට අයත් ඉඩම් සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ආසන්න ඉඩම පවරා දෙන ලෙස කර තිබෙන ඉල්ලීමද එම සමාගම මේ දක්වා ඉටු කර නැත.

ආයතනයට පවරා ඇති මෙම ඇතැම් ඉඩම් පිටස්තර පුද්ගලයන්ද පරිහරණය කරමින් මුදල් උපයමින් සිටින නමුත් ගමනාගමන මණ්ඩලයට කිසිදු පියවරක් ගැනීමට හැකියාවක් නොමැති බව එම මණ්ඩලයේ නිලධාරියෙක් සඳහන් කළේය.

## රිච්ටර් පරිමාණ 8ක...

මෙරට දකුණු ඉන්දියානු සාගර කලාපය ආශ්‍රිතව රිච්ටර් පරිමාණ හයක (6.0) භූ කම්පනයක් පෙරේද (01 වැනිද) වාර්තා විය. මෙරට මුහුදු කලාපයේ සිට කිලෝමීටර් 1095 ක් දුරින් පෙර්ද (01 වැනිද) දහවල් 12.59 ට මෙම භූ කම්පනය සිදුවී තිබුණි.

එම භූ කම්පනය කොළඹ, ගාල්ල, නෙළුව, අකුරැස්ස, ඇඹිලිපිටිය ඇතුළු දිවයිනේ ප්‍රදේශ රැසකට දැනී තිබුණි.

ඉන්දියානු සාගර කලාපයේ අලුතින් නිර්මාණය වෙමින් පවතින තල මායිම ආශ්‍රිතව මෙවැනි භූ කම්පන ඉදිරි කාලයේදීද සිදුවිය හැකි බව ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අතුල සේනාරත්න පවසන්නේය.

මෙවැනි විශාල භූ කම්පන නිසා මෙරට ගොඩනැගිලිවලට බලපෑමක් තිබෙන බවද, කොළඹ නගරය ආශ්‍රිත උස් ගොඩනැගිලි වර්ගීකරණයකට ලක්කර ඒවායේ අවදානම් තත්ත්වයන් සම්බන්ධයෙන් නිසි අධ්‍යයනයක් සිදුකළ යුතුව ඇතැයිද ඔහු කීවේය.

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ මහල් නිවාස සම්බන්ධයෙන් පසුගියද කරන ලද සමීක්ෂණයකදී අනාවරණය වී ඇත්තේ එම මහල් ගොඩනැගිලි රැසක් අබලන් තත්ත්වයක පවතින බවය. මෙම මහල් ගොඩනැගිලිවල නිවාස ඒකක 908ක් තිබෙන බවද කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමකදීද අනාවරණය කෙරිනි.

මෙම මහල් නිවාස කොළඹ, තිඹිරිගස්යාය, රත්මලාන සහ මොරටුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටා තිබෙන අතර, ඒවා කොළඹ මහ නගර සභාව,ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, කම්කරු දෙපාර්තමේන්තුව, ස්වාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය යටතේ පාලනය වේ.

ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී ඒවා භූ කම්පන වලට ඔරොත්තු දෙන පරිදි සකස් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ආපද කළමනාකරණ අංශ වෙත දැනුවත් කර ඇත.

මේ වසරේ ජනවාරි මාසයේ සිට ඉකුත් 01 වැනිද දක්වා වූ කාලය තුළදී රට අභ්‍යන්තරයේ සහ ලංකාව ආශ්‍රිත සාගර කලාපය ආශ්‍රිතව භූ කම්පන 13 ක් සිදුවී ඇත. එම භූ කම්පන අතරින් වැඩිම අගයකින් යුතු භූ කම්පනයක් සිදුවූයේ පෙරේද (01 වැනිද) දිනයේදීය.

## දිනපොත

### කොමියුනිස්ට් පක්ෂයේ අසූවන සංවත්සරය මහරගමදී

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ අසූවන සංවත්සරය මහරගම තරුණ සේවා සභාවේදී අද (03 වැනිද) සවස 2.00 ට පැවැත්වේ. මෙරට අර්බුදයන්ට විසඳුම් වශයෙන් "ඉදිරිමගෙන් ඉදිරියට" ප්‍රතිපත්ති ප්‍රකාශනයද මෙහිදී ජනගත කෙරේ.

### මොනරාගලදී ජලභීතිකා එන්නත නොමිලේ

ජලභීතිකා එන්නත නොමිලේ ලබාදීමේ වැඩසටහනක් අද (03 වැනිද) මොනරාගල පොතුවිල් පාර 22 කණුව අසල සත්ව සායනයේදී පෙ.ව 10.00 සිට 12.00 දක්වා පැවැත්වේ.

### හුලන්දාවදී අද බත් දන්සලක්

ඇසළ පුර පසළොස්වක පොහොය නිමිත්තෙන් මොනරාගල හුලන්දව ගම්වාසීන් සංවිධානය කරන බත් දන්සල අද (03වැනිද) පෙ.ව 11.00 සිට හුලන්දව වම පන්සල හංදිය අසලදී පැවැත්වේ

### වකුගඩු රෝගීන්ට උපදේශන කඳවුරක් අද මානෙල්වත්තේදී

වකුගඩු රෝගීන්ගේ සංගමයේ මෙහෙයවීමෙන් රෝගීන් සඳහා පවත්වනු ලබන උපදේශන වෛද්‍ය කඳවුර අද (3 වැනිද) පස්වරු 1 සිට 5 දක්වා කැලණිය බොල්ලෑගල මානෙල්වත්ත රජමහා විහාරස්ථානයේ දී වකුගඩු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය සංජය හෙයියන්තුඩුවගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

### මනුෂ්‍යත්වය සුරැකීමෙහිලා බුදු දහමේ වගකීම" අන්තර්ජාතික සමුළුව කැලණිය සරසවියේදී

දහතරවැනි දලයි ලාමාතුමාගේ 88 වැනි ජන්ම දිනයට සමගාමීව "මනුෂ්‍යත්වය සුරැකීමෙහිලා බුදු දහමේ වගකීම" තේමාව යටතේ කැලණිය විශ්වවිද්‍යාලය සංවිධානය කරන අන්තර්ජාතික සමුළුව ජූලි මස 6 වැනිද එම විශ්වවිද්‍යාලයේදී පැවැත්වේ.

එම විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, සංස්කෘත හා පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයන අංශය, දර්ශන අධ්‍යයන අංශය හා ශ්‍රී ලංකා බෞද්ධ සහෝදරත්ව පදනම එක්ව සංවිධානය කරන මෙම සමුළුවේ අරමුණු වන්නේ මනුෂ්‍යත්වය වර්ධනය කර ගැනීම සඳහා ටිබෙට් හා ථෙරවාදී බුදු දහමේ හර පද්ධතීන් උපයෝගී කර ගැනීම, පරිසර ආරක්ෂණ කාර්යභාරය සිදු කිරීම, සංස්කෘතික සහයෝගිතාව වර්ධනය කර ගැනීම, පරිසර ආරක්ෂණය උදෙසා බුදු දහමෙන් ලැබෙන දයකත්වය අධ්‍යයනය කිරීම වේ. තව ද සාමය, පරිසර ආරක්ෂණය හා සංස්කෘතිය සමුළුවේ උප තේමාවන් වේ.

මෙම සම්මන්ත්‍රණයේ මුඛ්‍ය දේශනය ඉන්දියාවේ මධ්‍යම උසස් ටිබෙට් අධ්‍යයන ආයතනයේ හිටපු උපකුලපති මහාචාර්ය ජේෂ් නවාං සම්ටෙන් විසින් පවත්වන අතර දෙස් විදෙස් පර්යේෂකයන් රැසක් සමුළුවට සහභාගි වීමට නියමිතය.

## ගොවියට සජිත්...

ඒ අනුව ගොවියාගේ වී නිෂ්පාදනයට සාධාරණ මිලක් ලබාදීම සඳහා ගොවි සංවිධාන හා ගොවි නායකයන් සමග සාකච්ඡා කර මිල සූත්‍රයක් කඩිනමින් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවද විපක්ෂ නායකවරයා සඳහන් කළේය. විපක්ෂ නායකවරයා මේ බව ප්‍රකාශ කළේ කිරිදිඔය ව්‍යාපාරයෙහි ගොවි නියෝජිතයන් හා ගොවි නායකයන් සමග පැවැති සාකච්ඡාවකදිය.

එහිදි තවදුරටත් අදහස් දැක්වූ විපක්ෂ නායකවරයා මෙසේද සඳහන් කළේය. ගොවියාගේ වී සඳහා සාධාරණ මිලක් ඇති කිරීමට නම් වී කිලෝවක් නිෂ්පාදනය කිරීමට යන වියදමට සාපේක්ෂකව වී කිලෝවක් සඳහා ගොවියාට සාධාරණ මිලක් ලබා දිය යුතුයි. ඒ සඳහා පාර්ලිමේන්තුවේ නීතිගත කරගත් නිවැරදි මිල සූත්‍රයක් සකස් කිරීමේ වැඩ පිළිවෙළහි වගකම අපි බාර ගන්නාවා, ගොවියා ගැන කථා කරන විට අමතක කරන්න බැහැ පාරිභෝගිකයා. පාරිභෝගිකයත් රැකෙන්න විදියට මෙම මිල සූත්‍රය අපි සකස්කරන්නට ඕන. මගේ දේශපාලන කාලය තුළ දිගින් දිගටම අඳ ගොවි ජනතාව වෙනුවෙන් ලොකු හඬක් මම නැගුවා ඒ නිසා ඉඩම් හිමියන් මාත් සමග තරහා වුණා, කවුරු බලවත් වුණත් කවුරුත් තරහා වුණත් මම ඉස්සරට ගත් අඩිය ආපස්සට ගන්නේ නැහැ,

**මේ වසරේදී සිදුවූ භූ චලන**

| දිනය | ස්ථානය | විශාලත්වය (රිච්ටර් පරිමාණ) |
| --- | --- | --- |
| පෙබරවාරි 10 | බුත්තල | 3.0 |
| පෙබරවාරි 10 | බුත්තල | 3.5 |
| පෙබරවාරි 11 | වැල්ලවාය | 2.3 |
| පෙබරවාරි 22 | බුත්තල/වැල්ලවාය | 3.3 |
| මාර්තු 18 | *කිරින්ද (මුහුදු කලාපය) | 2.6 |
| මාර්තු 19 | ගෝමරන්කඩවල | |
| මාර්තු 24 | *සෙල්ලකතරගම | |
| මාර්තු 30 | බේරුවල මුහුදු කලාපය | |
| අප්‍රේල් 12 | *මොනරාගල | |
| අප්‍රේල් 24 | හම්බන්තොට සිට කි.මී.24 ක් දුරින් මුහුදු කලාපය | |
| මැයි 15 | නැගෙනහිර සෙල්ල කතරගම/ලුණුගම්වෙහෙර | 2.5 |
| ජූනි 05 | ගම්පොළ | 2.0 |
| ජූලි 01 දහවල් 12.59 | හම්බන්තොට සිට කිලෝමීටර් 1095 ක් දුරින් වූ මුහුදු කලාපය (South Indian Ocean) 6.0 | (මෙම භූ චලනය ගාල්ල, කොළඹ ඇතුළු ප්‍රදේශවලට දැනීම) |

*ජනතාවට නොදැනුනු භූ චලන

**භූ චලන සිදුවූ සංඛ්‍යාව**

| වසර | සංඛ්‍යාව |
| --- | --- |
| 2020 | 16 |
| 2021 | 18 |
| 2022 | 05 |

# කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk
කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk
Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

## මගී යකා නිසා පණ අදින යකඩ යකා

දුම්රිය ප්‍රවේශ පත්‍ර නොමැතිව වංචනික ලෙස දුම්රියේ ගමන් කරන මගීන් ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව දිනකට රුපියල් කෝටියක පාඩුවක් දරා ගැනීමට සිදුව ඇති බව අපගේ සති අග පුවත්පත මගින් ඉකුත් සතියේ අනාවරණය කෙරිණ. මෙම පාඩුව පියවා ගැනීමට දුම්රිය ප්‍රවේශපත්‍ර පිරික්සීමේ වැටලීම් කෙතරම් ක්‍රියාත්මක කළත් සැලකිය යුතු ප්‍රතිඵලයක් ලබාගැනීමට නොහැකි වී ඇතැයි දුම්රිය දෙපාර්තමේන්තු ආරංචිමාර්ග සඳහන් කරයි. රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයකට දිනකට රු පි යල් කෝටියක පාඩුවක් දරා ගැනීමට සිදුවීම කිසිසේත්ම සුළුපටු කරුණක් නොවන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත. බොහෝ විට මෙරට පාඩු ලබන රාජ්‍ය ආයතන අතර දුම්රිය දෙපාර්තමේන්තුවේ නම නිතරම කියවෙන්නකි. වසර 150ක් තරම් පැරණි දුම්රිය දෙපාර්තමේන්තුව 1943න් පසු ශුද්ධ ලාභයක් ලබා නොමැත. යටත්විජිත යුගයේ ඇරඹුණු දුම්රිය සේවය කිලෝමීටර 1508ක දුරක් දක්වා විහිද තිබේ. මෙසේ ව්‍යාප්ත වුවද දුම්රිය සේවය පාඩු ලබන තත්ත්වයට පත්වීම පිළිබඳ නිරන්තරයෙන් අවධානයට ලක්වේ. රජයේ පාඩු ලබන ආයතන අතර මුල්තැනක් එයට හිමි වීම පුදුමයට කරුණක් නොවන්නේ 2010 සිට 2020 දක්වා වසර දහයක කාලය තුළ දුම්රිය දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 331ක් කාබාසිනියා කර තිබෙන හෙයිනි. 2020 වසරේදී පමණක් බිලියන 45ක් අහිමි වී ඇත. එක්තරා පැත්තකින් බලන කළ දිනකට රුපියල් කෝටියක් අහිමි කරගෙන දුම්රිය දෙපාර්තමේන්තුව මේ ආකාරයට හෝ පැවැතීම පුදුමය දනවන කරුණක්ය. දුම්රියේ පරිහානිය සම්බන්ධයෙන් බොහෝ විට ඇඟිල්ල දික්වනුයේ දේශපාලනඥයන්ට සහ නිලධාරින්ටය. මගීන්ද චෝදනා කරන්නේ මේ අයටය. එහෙත් මෙකී කරුණුවලින් පෙනෙන්නේ තමන්ගේ බඩ සුද්ධයැයි සිතා කතා කළද මගී ජනතාව දුම්රියේ පරිහානියට අනිවාර්යෙන්ම වගකිව යුතු බවය. පසුගිය කාලයේ දුම්රිය ප්‍රවේශපත්‍රවල මිල ගණන් වැඩි වූයේද මහලොකු ගණන්වලින් නොවේ. එහෙත් සාමාන්‍ය දුම්රිය ප්‍රවේශපත් සඳහා තවම අයකරනුයේ ඉතා සොච්චම් මුදලකි. එකී සොච්චම් මුදලද නොගෙවා ලක්ෂයකට අධික පිරිසක් දිනපතා දුම්රියෙන් ගමන් කරන්නේ ඉතාම කැත හොර හිත නිසා මිසක් දුප්පත්කම නිසා නොවන බව අවධාරණය කළ යුතුය.

රාජ්‍යයට ඕනෑතරම් මුදල් තිබේ යැයිද ඒ නිසා රාජ්‍ය සේවා සියල්ල නොමිලේ ලැබිය යුතුයැයිද යන ආකාරයේ ඉතා මුග්ධ අදහසක් මෙරට බොහෝ දෙනකු තුළ තිබෙන බව පෙනේ. ඔවුන් සිතන්නේ රාජ්‍යය කල්ප වෘක්ෂයක් යැයි කියාය. ඒ නිසා රාජ්‍යයට හොරකමක් වංචාවක් කළාට කමක් නැතැයි මෙකී මුග්ධයෝ කල්පනා කරති. සැබැවින්ම මේ හොරකම වංචාව කරන්නේ තමන්ටම බව ඔවුන්ට නොවැටහීම රටේම කරුමයක් මිස වෙන කුමක්ද? මෙසේ දුම්රියේ හොරෙන් යන අයට සිගරැට්ටුවක් මිලදී ගැනීමට, හවසට අරක්කු භාගයකින් සප්පායම් වීමට අතේ මුදල් නොතිබෙන්නේ නම් එයද පුදුමයට හේතුවකි. එහෙත් ඔවුන් දුම්රියට මුදල් නොදී ගමන් කරන්නේ පෙර කී මුග්ධ මානසිකත්වය නිසාය. තමන් මුදල් නොගෙවා දුම්රියේ ගමන් කිරීමෙන් දුම්රිය දෙපාර්තමේන්තුව බිඳ වැටෙන බව ඔවුන් කල්පනා නොකරන්නේ එහෙයිනි. එහෙත් හදිසි දුම්රිය බිඳ වැටීමක් හෝ වෙනයම් ගැටලුවක් පැන නැගුණු විට මොවුහු මහ වීරයෝ සේ තම විරෝධය පළ කරති. මේ අය කෙතරම් දුම්රිය සේවාව ගැන නොසිතන්නේ ද යන්න පැහැදිලි වනුයේ දුම්රිය මැදිරිවල කොටා තිබෙන විවිධ බහුරූ කෝලම් දකින විටය. එසේම මෙවැන්නෝ අසුනක හිඳගත් විට දෙතුන් දෙනකුට වාඩි විය හැකි ඉඩ ආවරණය කර ගනිමින් අනෙක් අයට ඉඩක් නොදෙන්නෝය. එසේම මොවුහු දුම්රිය මැදිරි කල්ලි කණ්ඩායම් හැදී පෞද්ගලික දේපළක් සේ පරිහරණය කරති. වෙනත් මගීන් එම මැදිරිවලට ගොඩවෙනවාට ද ඔවුන් කැමැති නැත.

දුම්රිය සේවාව පාඩු ලැබීමට එකම හේතුව මගීන් ප්‍රවේශපත් නොමැතිව හොරෙන් ගමන් කිරීම යැයි අප සඳහන් කරන්නේ නැත. ඒත් එය එක් ප්‍රධාන හේතුවකි. සීමා රහිත සහ නීති විරෝධී අතිකාල ගෙවීම්, දේශපාලන බලපෑම් මත රඳවා ගත් සේවක අතිරික්තයක් සිටීම ආදී කරුණු රැසක් දුම්රිය සේවය බිඳ වැටීමට බලපා තිබේ. තවම බොහෝ විට මෙරට භාවිත වනුයේ වික්ටෝරියානු යුගයේ තාක්ෂණික උපකරණය. ඇමරිකාව, ජපානය, චීනය ආදි රටවල දුම්රිය සේවය තාක්ෂණයෙන් හා කළමනාකරණයෙන් නවීකරණ වී තිබේ. එහෙත් මෙරට දුම්රිය සේවාව නවීන තාක්ෂණය අනුව නවීකරණය කරනවාට එහි පැල්බැඳගෙන සිටිනවුන් කැමැති නැත. නවීන තාක්ෂණය යොදගන්නේ නම් මගීන් ලක්ෂයකට නොව එක මගියකුටවත් දුම්රියෙන් හොරෙන් ගමන් කළ නොහැකිය. ටිකට්පත් පරීක්ෂා කිරීමට හෝ නිකුත් කිරීමට විශාල සේවක පිරිසක්ද වුවමනා වන්නේද නැත. එනිසා අප අවධාරණය කරන්නේ දුම්රිය දෙපාර්තමේන්තුව පාඩු නොලබන ආයතනයක් කිරීමට නම් එය දැවැන්ත තාක්ෂණිකකරණයකට ලක්කළ යුතු බවය. දුම්රියේ පමණක් නොව මෙරට සියලු ආයතන එවැනි තාක්ෂණිකකරණයකට ලක්කරන්නේ නම් බොහෝ වංචා දූෂණ වළක්වාගත හැකිය. වරින් වර පත්වන දුම්රිය ලොක්කන්ට අලුත් දුම්රිය මැදිරි ගෙන්නනවා හැරෙන්නට වෙනත් අලුත් යමක් කළ නොහැකිය. ඒ සඳහා ඔවුනට වූ වමනාවක් හෝ වැඩපිළිවෙළක් නොමැත. රටට හෙණ ගැහුවත් ඔවුන් කල්පනා කරන්නේ ප හසු කුටුම්භ සංරක්ෂණ ක්‍රමයක් හැටියට දුම්රිය දෙපාර්තමේන්තුව පවත්වාගෙන යාමටය. ලෝකයේ විශාලතම දුම්රිය සේවාවට හිමිකම් කියන ඇමරිකාවේ දුම්රිය සේවය කිලෝමීටර 250,000ක් වැනි සුවිශාල දුරක් දක්වා ව්‍යාප්ත වී තිබේ. එහෙත් අපේ දුම්රිය දෙපාර්තමේන්තුවට කිලෝමීටර 1508ක් වැනි දුරක් කළමනාකරණය කරගත නොහැකිය. කිලෝමීටර 1508 කෙසේ වෙතත් මගීන් ලක්ෂයක් ප්‍රවේශපත් නොමැතිව ගමන් කිරීමේ අර්බුදය තවම ඔවුනට විසඳ ගැනීමට නොහැකි වී තිබේ.

---

# රනිල් මහත්තයා රහස් ඡන්දයක් තිබ්බොත්
# සුදුසු කෙනා එජාප නායකයා වේවි



**නවීන් දිසානායක යනු එජාපයේ ජ්‍යෙෂ්ඨයෙකි. කලක් එජාපයේ නායකත්වය බලාපොරොත්තුවෙන් සිටි ඔහු මේ වනවිට සබරගමු පළාතේ ආණ්ඩුකාර ධුරයට පත්වී ඇත. නව තනතුරත් සහ එජාප නායකත්වය බලාපොරොත්තුව ගැන මේ සංවාදය සබරගමුව පළාතේ ආණ්ඩුකාර නවීන් දිසානායක සමගිනි.**

**ඔබ බොහෝ කාලයක් තිස්සේ එජාපයේ නායකත්වය දිහා ඇහ ගහගෙන හිටි අයෙක්. ඔබ වරින් වර කළ ප්‍රකාශයන්වලිනුත් ඔබ නායකත්වය බලාගෙන හිටි බව පේනවා. දැන් ඔබට අලුත් තනතුරක් ලැබිල. ඒ ආණ්ඩුකාර ධුරයක්. මේත් එක්ක ඔබේ නායකත්ව හීනයට මොකද වෙන්නේ....**

ජේ. ආර්. ජයවර්ධන මහත්තයා 1977න් පස්සේ එජාපයට නායකයන් කීපදෙනෙක් බිහි කළා. එයින් අද ඉන්න ජනාධිපතිවරයා සමග දෙන්නෙක්ම ජනාධිපති ධුරයට පත්ව තිබෙනවා. තවත් කෙනෙක් ජනාධිපති අපේක්ෂකයෙක් වුණා. අනෙක් කෙනා ජනාධිපති විය යුතු කෙනෙක් වුණත් කිරුළපනදී ඔහු ඝාතනයට ලක් වුණා. ඒ කියන්නේ නායකත්වයට එන්න වෙන්නෙ දෛවයත් එක්කයි. එජාපයේ අනාගත නායකත්වයට දක්ෂයන්ට අවස්ථාව ලැබෙන පරිදි රහස් ඡන්දයක් හෝ පවත්වන්න රනිල් වික්‍රමසිංහ මහතා කටයුතු කරනවා නම් ඒක ඉතාම සාධාරණයි. එජාප නායකයන් තෝරා ගෙන තිබෙන්නෙම රහස් ඡන්දයෙන්. ඒ ක්‍රමය ඉදිරියටත් අනුගමනය කළොත් සුදුසු කෙනා එජාපයේ අනාගත නායකයා වේවි.

**ඔබ හිටපු කැබිනට් අමාත්‍යවරයෙක්. කැබිනට් ධුරයට වඩා ලැබුණු ආණ්ඩුකාර ධුරය හොඳයි ද?**

ආණ්ඩුකාර ධුරයත් කැබිනට් අමාත්‍ය ධුරයකට සමාන තනතුරක්. ඇත්තටම මට මේ තනතුර දෙන්න ජනාධිපතිවරයා කතා කරල තිබ්බෙ මීට මාස අටකට විතර පෙර ඉඳලයි. ඉදිරියටත් දේශපාලනය කරන්න ඉන්න මට මේ තනතුර නිසා පළාත් සභාවේ ක්‍රියාකාරිත්වය ගැන හොඳ අවබෝධයක් ලබා ගන්න පුළුවන්. මොකද අපිට අත්දැකීම් තිබෙන්නෙ පාර්ලිමේන්තු ක්‍රමය ගැන විතරයිනෙ. දැන් මට පළාත් සභා ක්‍රමය ගැනත් හුඟක් දේවල් ඉගෙන ගන්න පුළුවන්. ඉස්සර නම් ආණ්ඩුකාර ධුරය නමට විතරයිනෙ. දැන් පළාත් සභා නැති නිසා ආණ්ඩුකාරවරයාට තමයි පළාතේ සියලු කටයුතුවල බලය පැවරී තිබෙන්නෙ. අමාත්‍යාංශ පහක් තිබෙන්නෙ ආණ්ඩුකාරවරයා යටතේයි. ඒ නිසා මේ අමාත්‍යාංශ හරහා සබරගමුව පළාතට උසස් සේවාවක් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

**ඔබේ පියා මේ රටේ නම කියැවෙන දේශපාලන චරිතයක්. හැබැයි ඔහු දේශපාලන ජීවිතයේ අත්කරගත් ජයග්‍රහණයන් ඔබට තවමත් අත්කර ගැනීමට ලැබී නැහැ නේ ද?**

ඇත්තටම මගේ පියාටත් ලලිත් ඇතුලත්මුදලි, ප්‍රේමදාස, රනිල් වික්‍රමසිංහ මේ අයට දැවැන්ත ශක්තියක් වුනේ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා. 1977 හයෙන් පහක බලයක් ගත්තු ජේ. ආර්. ජනාධිපතිවරයා මේ හැමකෙනාටම හොඳ අමාත්‍ය ධුර ලබා දුන්නා. මහවැලිය භාර දෙන කොට මගේ පියාට වයස අවුරුදු තිස්පහයි. අවුරුදු 41 වෙද්දි මහවැලිය ස්ථාන පහකින් බ්ලොක් කරල ජලාශ ඉදිකළා. එවැනි හපන්කමක් වෙන කාටවත් කරන්න පුළුවන් වෙලා නෑ. ඇත්තටම එහෙම වැඩ කරන්න අවස්ථාව දුන්නෙ ජේ. ආර්. ජයවර්ධන මහත්තයයි.

**ඔබ මේ කියන්නෙ ඔබට ඔබේ පියාට වගේ අවස්ථාවක් ලබාදුන්නෙ නෑ කියල ද?**

මම දේශපාලනයට ආවේ 2000 දි. මට ඇමති ධුරයක් ලැබෙන්න වසර දහයක් ගත වුණා. හැබැයි මගේ පියාට එහෙම නෑ. එකවරම කැබිනට් අමාත්‍ය ධුරයක් ලැබුණා. එනිසයි එතුමට වැඩ කරන්න පුළුවන් වුණේ. මට මුලින්ම ලැබුණෙ නියෝජ්‍ය අමාත්‍ය ධුරයක්. ඒ අමාත්‍යාංශ එක්ක රටට වැඩක් කරන්න අවස්ථාවක් තිබුණෙත් නෑ. ඒ නිසා මම හිතන්නෙ දැන් කාලය අපේ පියතුමාලාගේ කාලයට වඩා වෙනස්. අපි කැපවීමෙන් අධිෂ්ඨානශීලිව වැඩ කර ගෙන යනවා. මම විශ්වාස කරනවා අනාගතයේදී මටත් හොඳ අවස්ථාවක් ලැබෙයි මගේ පියතුමා වගේ වැඩ කරන්න කියල.

**පළාත් සභාවල දේශපාලන බලය ආණ්ඩුකාරවරයාට කේන්ද්‍ර ගතවීම නිසා නිලධාරීන්ගේ ඒකාධිපතිත්වයක් ක්‍රියාත්මක වන බවට චෝදනා එල්ල වෙනවා. මේ තත්ත්වයට ඔබ මුහුණ දෙන්නෙ කොහොම ද?**

මගේ දේශපාලන ජීවිතය තුළ මට නිලධාරින් ප්‍රශ්නයක් වෙලා නෑ. අනෙක මම නිලධාරින් ප්‍රශ්නයක් කරගෙනත් නෑ. මම විවිධාකාරයේ නිලධාරින් එක්ක වැඩ කරල පළපුරුද්දක් තිබෙනවා. මොක ද මේක මගේ පළමු දේශපාලන තනතුර නොවෙයිනෙ. ඒ නිසා නිලධාරින් එක්ක වැඩ කරන විදිය මම දන්නවා. ඔබ කියන කාරණය මම පිළි ගන්නවා. මොකද 2014 ඉඳලම පළාත් සභාවල දේශපාලන බලය ආණ්ඩුකාරවරයාට කේන්ද්‍ර ගත වුණා. මේ නිසා නිරන්තර සෘජු අධීක්ෂණයක් නැති උනාම නිලධාරීන් ඔවුන්ගේ හිතුමතයට වැඩ කරන්න ඉඩ තියෙනවා. ඇත්තටම ජනතාව මුහුණ දෙන බොහෝ ප්‍රශ්නවලට උත්තර තිබෙන්නෙ නිලධාරින් ළඟයි. ජනතාව අපි ළඟට ආවාමත් අපි කතා කරන්නෙ නිලධාරින්ටයි. ඒ නිසා නිලධාරින් ජනතා ප්‍රශ්න ගැන සංවේදීව කටයුතු කරලා ජනතාවට සහනයක් ලබා දෙන්න තමන්ගේ රාජකාරිය යොදා ගනී කියල මම විශ්වාස කරනවා. කොහොම වුණත් මම විශ්වාස කරනවා නිලධාරින් එක්ක මට සහයෝගයෙන් අන්‍යෝන්‍ය අවබෝධයෙන් කටයුතු කරන්න පුළුවන් කියල.

**පළාත් සභාවල වංචා දූෂණ බහුල බවට කලක ඉඳන් චෝදනා නැගෙනව. පළාත් සභා මෙරටට අවශ්‍ය නෑ කියන්නත් එයත් එක හේතුවක් වෙලා. ඔබ ඒ ගැන අවදානයක් යොමුකර තියෙනව ද?**

පළාත් සභාවල දැන්නම් වංචා දූෂණ කරන්න සල්ලි නෑ. මොකද අපිට මුදල් ලැබෙන්නෙ වැටුප් ගෙවන්න පමණයි. මේ නිසා ව්‍යාපෘති හරහා වංචා දූෂණයක් වෙන්න දැන් ඉඩක් නෑ. නමුත් ජනතාවගේ කටයුතුවලදී නිලධාරින් හෝ තැරව්කරුවන් පගාව ගන්නවද කියන එක ගැන අපි අවධානය යොමු කරන්න ඕනේ. ඒ වගේම අපේ පළාත් සභාවේ විගණන වාර්තාවලින් මතු කර දෙන කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මම අපේ පළාත් සභාවේ නිලධාරින්ගෙන් බලාපොරොත්තු වෙන්නෙ තමන් ළඟට සේවා ලබා ගැනීමට එන ජනතාවට හොඳට හිනාවෙලා සුහදව කතා කරලා හැකි ඉක්මනින් ප්‍රශ්න විසඳන්න කටයුතු කරාවි කියල. සමහර තැන්වල වැඩ කර ගන්න ගිහාම සල්ලි තමයි ඉස්සර වෙන්නෙ. අපි මේ සංස්කෘතිය නැති කරන්න ඕනේ. නමුත් අවාසනාවකට දූෂණය වංචාවට විරුද්ධයි කියන ජනතාව මැතිවරණවලදී නැවත නැවත බලය දෙන්නෙ වංචාව දූෂණයට සම්බන්ධ අයටම කියලත් චෝදනා එල්ල වෙනවානෙ. ඒ ගැන ජනතාවත් අවධානය යොමු කරන්න ඕනේ.

**අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩි වගකීමක් තිබෙන්නෙ පළාත් සභාවලටයි. නමුත් ගුරුවරු දේශපාලන හිතවත්කම් මත නගරයේ පාසල්වලට කේන්ද්‍ර ගත වීම නිසා ගම්බද පාසල්වල දරුවන්ට අසාධාරණයක් වෙනවා. මේ ගැන ඔබ මොනවද කියන්නෙ?**

ඇත්තටම මමත් දැනගෙන හිටියේ නෑ ලංකාවේ විශාලම අධ්‍යාපන කලාපය තිබෙන්නෙ සබරගමුව පළාත් සභා බල ප්‍රදේශයේ කියල. නමුත් මම රාජකාරි ආරම්භ කළාට පස්සේ දැන ගත්තා දෙහිඕවිට අධ්‍යාපන කලාපය තමයි ලංකාවේ විශාලම අධ්‍යාපන කලාපය කියල. ගුරු හිඟයක් තිබෙනවා. නමුත් අලුතින් ගුරුවරු බඳවා ගන්න අපිට මුදල් නෑ. මේ නිසා දැනට ඉන්න ගුරුවරු යොදගෙන තමයි පළාතේ අධ්‍යාපන කටයුතු කරගෙන යන්න ඕනේ. මගේ පළාතේ කිසිම ගුරුවරයකු දේශපාලන බලපෑම් මත ස්ථානමාරු කරන්නෙ නෑ. දැනටත් සමහර දේශපාලන හිතවතුන් මගෙන් ඉල්ලීම් කරනවා. ඒ සියල්ල මම ප්‍රතික්ෂේප කරල අත්‍යවශ්‍ය ස්ථාන මාරු ලබා දීම සඳහා කමිටුවක් පත් කරලා ඒ කමිටු නිර්දේශය අනුව කටයුතු කරනවා. මෑතක පත්වීම් ලැබූ ගුරුවරු හත්සීයක් මේ පළාතට අනුයුක්ත කරල තිබෙනවා. ඒ අයගෙන් දැනටමත් එකසිය පනහක් විතර තමන්ට ලැබුණ පාසල වෙනස් කර දෙන්න කියල ඉල්ලීම් කරල තියෙනවා. මම ඒ එකම ඉල්ලීමක්වත් ඉටු කරන්නෙ නෑ. දේශපාලනඥයිනුත් මට කතා කරල ඉල්ලීම් කරනවා. නමුත් මම ඒ එකම ගුරුවරයකුවත් ඔවුන්ට ලැබී තිබෙන පාසලින් ඉවත් කර ගන්න දෙන්නෙ නෑ. මේ ගුරුවරු තරුණ පිරිසක්. ඒ අය ඉගෙන ගත්තෙ මහජන මුදලින්. ඔවුන් එකඟවී තිබෙනවා ඕනේම ප්‍රදේශයක සේවය කරනවා කියල. ඒ නිසා ඒ එකඟතාව උල්ලංඝනය කරන්න මම සහය වෙන්නෙ නෑ.


**සබරගමුව පළාත කියන්නෙ මෙරට ඩොලර් ගෙන්විය හැකි කර්මාන්තයක් තියෙන පළාතක්. විශේෂයෙන් රත්නපුර කියන්නෙ මැණික් සම්බන්ධයෙන් ලෝකයට ගිය නමක්. ඩොලර් ඉලක්ක කරමින්, මැණික් කර්මාන්තය නංවන්න වැඩපිළිවෙළක් ඔබට තියෙනව ද?**

මම වැඩ භාර ගෙන තවමත් සති දෙකයි ගෙවිල තියෙන්නෙ. ඔබ කියන කාරණය ගැන මටත් අවබෝධයක් තිබෙනවා. නමුත් මැණික් කර්මාන්තය ගැන මට තව දුරටත් අවබෝධයක් ලබා ගන්න ඕනෙ. රත්නපුර මැණික් කියන්නේ අපේ රටට විශාල සම්පතක්. නමුත් දැන් එහි තත්ත්වය කොහොමද අධ්‍යයනය කරන්න ඕනේ. අපිට මැණික් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් නෑ. ඒ නිසා මේ ගැන වෙනම අධ්‍යයනය කරන්න ඕනේ. ජනාධිපතිවරයා අතින් එන 12 වනද අලුත් මැණික් කුලුන විවෘත කරනවා. මැණික් කර්මාන්තයේ අතීතයේ පැවැති සම්ප්‍රදාය තමයි තවමත් ක්‍රියාත්මක වෙන්නෙ. ඉහළ ධනපති පන්තියක් ඉන්නවා. පහළ ඉන්නෙ දෛනික කුලියට මැණික් කර්මාන්තයේ යෙදෙන කුලිකරුවන්. මේ ක්‍රමය වෙනස් කරලා මැණික් කර්මාන්තයේ ධනය පහළම ඉන්න කුලිකරුවාටත් ලබා ගත හැකි ක්‍රමයක් සකස් කරන්න ඕනේ. එහෙම කරන්නෙ කොහොම ද කියල අධ්‍යයනය කරන්න ඕනේ. අනෙක මැණික් කර්මාන්තය පරිසර හිතකාමීව දියුණු තත්ත්වයට උපයා ගන්නෙ කොහොම ද කියලත් අපි අවධානය යොමු කරන්න ඕනේ.

**ඔබ නැවත පාර්ලිමේන්තු එන්න අපේක්ෂා කරනවාද?**

ඔව්, මම පළාත් සභාවේ දිගටම ඉන්න අදහසක් නෑ. මම මෙතැන ඉන්න කාලයෙදි මගේ උපරිමයෙන් මේ පළාතට සේවයක් කරනවා. ඊළඟ මැතිවරණයේදී මම නැවත පාර්ලිමේන්තු එන්න තමයි බලාපොරොත්තු වෙන්නෙ. මම මීට පෙරත් වසර විස්සක් පාර්ලිමේන්තුව නියෝජනය කරලා නුවරඑළිය දිස්ත්‍රික්කයට විශාල සේවයක් කරලා තිබෙනවා. මට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා ගැන ලොකු විශ්වාසයක් තිබෙනවා. නැවත පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමට ශක්තියක් වෙන්න මට පුළුවන්.

■ සංවාදය - ජයසූරිය උඩුකුඹුර




## ගපිරිගේ කවිය

### රත්තරං සහ මන්ත්‍රිලා

මන්ත්‍රිවරයකුගෙ ඉල්ලීමක් සලකා
රේගුව රත්තරං නිදහස් කළ කෙනෙකා
කෙරුවට චෝදනා අපි, ඔබ සහ අනෙකා
අභියාචනාවෙන් නිදහස් පින් සලකා

දුක්ගැනවිල්ල ඇත්තක්නම් කමක් නැත
නීතියෙ හැටියට ම වැඩනං වෙලා ඇත
මන්ත්‍රිකමට සලකන හැටි ලොවෙත් නැත
මේ බොරු අහල අහල ම කන් පිරී ඇත




ඡායාරූප - ෆේස් බුක් සමාජ මාධ්‍ය ජාලයෙනි.

# පේරාදෙණි සරසවිය බලන්න ලක්ෂ 4ක්

## පරිසරයට දැඩි හානි


■ සාලිය කුමාර ගුණසේකර
■ කමල් සුරවීර - මහනුවර

පේරාදෙණිය විශ්ව විද්‍යාලය මහජන ප්‍රදර්ශනයට විවෘත කිරීමෙන් පසු එය නැරඹීමට පැමිණි පිරිස විශ්ව විද්‍යාල භූමියේ පරිසර පද්ධතියට දැඩි ලෙස හානිකර ඇති අයුරු දැකගත හැකිය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයට වසර අසූවක් (80) සැපිරීම නිමිත්තෙන් විශ්ව විද්‍යාලය මහජන ප්‍රදර්ශනය සඳහා පෙරේද (01 වැනිදා) විවෘත කෙරිණි. විශ්වවිද්‍යාලය දැකබලා ගැනීමට ලක්ෂ හතරක පමණ පිරිසක් පැමිණ සිටියහ.

මෙලෙස පැමිණි නරඹන්නන් විශ්වවිද්‍යාල පරිසර පද්ධතියේ තැන තැන කසළ දමා විනාශ කර ඇති අයුරු දැකගත හැකිය. එමෙන්ම, විශ්වවිද්‍යාල භූමියේ තණකොළ සහ මල් වවා ඉතා අලංකාර ලෙස පවත්වාගෙන යනු ලබන ස්ථානවල වාහන නවතා එම පරිසර පද්ධතියටද දැඩි ලෙස හානිකර තිබේ. මෙම පරිසර පද්ධතිය යළි තිබූ පරිදි සකස් කිරීමට තවත් කාලයක් ගතවනු ඇතැයිද අනාවරණය වේ.

එමෙන්ම විශ්වවිද්‍යාලය නැරඹීමට පැමිණි පිරිස විශ්වවිද්‍යාල භූමියේ ගස්වල වැල්වල එල්ලී සෙල්ලම් කරන අයුරුද දැකගත හැකිවිය. අසූවන සංවත්සර උත්සවයට සමගාමීව ශාස්ත්‍ර, විද්‍යා, වෛද්‍ය, ඉංජිනේරු, දන්ත, පශු, සම සෞඛ්‍ය ඇතුලු පීඨ නවය නැරඹීමට අවස්ථාව සැලසීමට විශ්වවිද්‍යාලයේ කුලපති සම්මානිත මහාචාර්ය ජී. එච්. පීරිස් ඇතුළු පාලනාධිකාරිය විසින් කටයුතු කරන ලදි. ලෝක උරුමයක් බවට පත්වූ මහාවංශය, කුඩාම බයිබලය, ජෙට් එන්ජිම, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය කෞතුකාගාරය, පුස්කොළ ග්‍රන්ථ සංරක්ෂණ ව්‍යාපෘතිය ඇතුළු අංග ගණනාවක් ප්‍රදර්ශනය කෙරිණි.

# චෝදනා නැති සුදුස්සකු පොලිස්පති ධුරයට පත්කරන්න



- ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ අනුනායක
**කැප්පෙටියාගොඩ සිරිවිමල හිමි**

**රටේ නීතිය සහ සාමය රකින පොලිසිය තවදුරටත් අරාජික නොකර චෝදනා නැති සුදුස්සකු පොලිස්පති ධුරයට පත්කළ යුතු යැයි ගැටඹේ ශ්‍රී රාජෝපවනාරාමාධිපති ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ අනුනායක කැප්පෙටියාගොඩ සිරිවිමල නාහිමියෝ පවසති.**

පසුගිය කාලයේදී පොලිසියට විවිධ චෝදනා එල්ල වූ බවත්, මේ තත්ත්වය මත පොලිසියට කීර්තියක් ගෙන දිය හැකි නිලධාරියකු පොලිස්පති ධුරයට පත්කිරීම ගැන ජනාධිපතිවරයාගේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇතැයිද අනුනාහිමියෝ පෙන්වා දෙති. මෙම ඉහළ තනතුරට පත්කිරීමේ හුදෙක් ජනප්‍රියකම පමණක් නිර්ණායකයක් ලෙස නොගත යුතු බවත්, එවන් තීරණ ගත් අවස්ථාවලදී පොලිසියට අපකීර්තියක් ඇතිවූ බවත් කැප්පෙටියාගොඩ සිරිවිමල අනුනාහිමියෝ කියති. පොලිස්පති ධුරයට පත්කිරීමේදී යම් යම් බලපෑම් එල්ල වන බව දැනගන්න ලැබී තිබෙන බවත් ඒ කිසිම බලපෑමකින් තීරණ නොගෙන ජනාධිපතිවරයා මේ සම්බන්ධයෙන් සෘජු තීරණයක් ගත යුතු බවත් අනුනාහිමියෝ කියති.

තවදුරටත් මෙම ඉහළ තනතුර හිස්ව තැබීම නරක පූර්වාදර්ශයක් නිසා කඩිනමින් මේ සම්බන්ධයෙන් ජනාධිපතිවයාගේ අවධානයය යොමුවිය යුතු යැයිද අනුනාහිමියෝ කියති.

## පොලිස්පති ධුරය ගැන

# කාදිනල් හිමිගේ ලිපිය අනුමත කළ නොහැකියි



- අස්ගිරි පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී
**නාරම්පනාවේ ආනන්ද හිමි**

**ආගමික නායකයන් ආණ්ඩුවට බලපෑම් කිරීම මෙන්ම උපදෙස් දිය යුතු කාරණා තිබුණත් රටේ ආරක්ෂාවට බලපාන පොලිස්පති ධුරය සම්බන්ධයෙන් කරන අතපෙවීම් කිසිසේත්ම අනුමත කළ නොහැකි යැයි අස්ගිරි පාර්ශ්වයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී නාරම්පනාවේ ආනන්ද නාහිමියෝ පැවසූහ.**

ආගමික නායකයන් මේ අන්දමින් බලපෑම් කිරීමට පටන් ගතහොත් ඉදිරියේදී රජයට කිසිදු තනතුරක් පත්කර ගැනීමට නොහැකි වනු ඇතැයිද ආනන්ද හිමියෝ කියති. අන්‍යාගමික නායකයන් මෙලෙස බලපෑම් කරන විට බහුතර බෞද්ධයන්ගේ පැත්තෙනුත් බලපෑම් කිරීමට පටන් ගතහොත් රජයට කිසිවක් කරගත නොහැකි වනු ඇතැයිද උන්වහන්සේ සඳහන් කරති.

පොලිස්පති ධුරය සම්බන්ධයෙන් කාදිනල්තුමා යම්කිසි ලිපියක් ජනාධිපතිවරයාට යවා ඇතැයි දැනගන්නට ඇති බවත්, එය කිසිසේත්ම අනුමත කළ නොහැකි බවත් නාරම්පනාවේ ආනන්ද හිමියෝ කියති. හිස්ව පවතින පොලිස්පති ධුරයට සුදුසු ජ්‍යෙෂ්ඨයකු පත්කිරීම ජනාධිපතිවරයාගේ වගකීමක් බවද උන්වහන්සේ සඳහන් කරති.

පාස්කු ප්‍රහාරයේ දී සිය රාජකාරිය ඉටු කිරීම පැහැර හැර ඇති බවට චෝදනා එල්ල වී ඇති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන සහ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති තනතුරට පත් කිරීම ගැන සලකා බැලීම සහමුලින්ම නතර කර දමන ලෙසත් එම තනතුරට ඔවුන්ගේ නම් යෝජනා කිරීම හෝ සලකා නොබලන ලෙසත් ඉල්ලමින් මැල්කම් කාදිනල් රංජිත් හිමි ජනාධිපති රනිල් වික්‍රමසිංහට ඉකුත් 30 වැනිදා ලිපියක් යවා තිබිණි.

# ජහුටා බලන්න ගිය තරුණයකුගේ සිරුර ළිඳකින් සොයාගනී

■ සචින් කරුණාරත්න - මරදන්කඩවල

තිරප්පනේ, ඉදිගහවැව ගම්මානයේ පැවැති නාට්‍ය සන්දර්ශනයක් නැරඹීමට ගිය තරුණයකු ළිඳකට වැටීමෙන් මියගොස් ඇත. මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ පුංචිකුලම, කුඩාගම ලිපිනයෙහි පදිංචි 28 හැවිරිදි විවාහක තරුණයෙකි. ඔහු වෘත්තියෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාලගණක ක්‍රියාකරුවකු ලෙස සේවය කර ඇත.



ඉකුත් දින 5ක් මුළුල්ලේ ඉදිගහවැව ගම්මානයේ රාත්‍රි කාලයේ දෙබස් කථන මුද්‍රා ගීත නාට්‍ය සන්දර්ශන මාලාවක් (ජහුටා) පවත්වා තිබේ. එහි සිවුවන දිනය වූ 30 වැනිද රාත්‍රියේ තවත් මිතුරන් තිදෙනකු සමග ඔහු නාට්‍ය පොළට ගොස් ඇත. නාට්‍ය පොළට ඇරලවා මිතුරන් තිදෙනා යළි නිවසට පැමිණ තිබේ.

නාට්‍ය සන්දර්ශනය නිම වී පසු දින ඔහු යළි නිවසට නොපැමිණීමත්, ඔහුගේ යතුරු පැදිය නාට්‍ය පොළේ රථ ගාලේ තිබීමත් නිසා පවුලේ ඥාතීන් හා මිතුරන් ඔහු සෙවීමට පටන් ගෙන තිබේ. එහිදී නාට්‍ය පොළට කිලෝමීටර් 6ක් පමණ දුරින් ඔහුගේ නිවසට යන ප්‍රධාන මාර්ගයට ආසන්න අඩි 30ක් පමණ දුරින් පිහිටි ළිඳක ඔහුගේ පාවහන් යුගළ පාවෙන අයුරු දැක ඇත. පසුව සොයා බැලීමේ දී ඔහුගේ සිරුර ළිඳේ තිබී හමු වී තිබේ.

# රනිල් පාර්ලිමේන්තු බලතල අතට අරන්



- මුජිබර් රහුමාන් (ස.ජ.බ.)

■ අනීෂා මානගේ

**පාර්ලිමේන්තුව නිශේධ කර පාර්ලිමේන්තුවේ බලතල රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා විසින් පවරාගෙන ඇතැයි සමගි ජනබල වේගයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මුජිබර් රහුමාන් ඊයේ (02 වැනිදා) කොළඹදී පැවැති මාධ්‍ය සාකච්ඡාවක් අමතමින් පැවැසීය. වැඩිදුරටත් අදහස් දක්වමින් මන්ත්‍රීවරයා මෙසේද කීවේය.**

"ජනාධිපතිතුමාට පාර්ලිමේන්තුවේ බලතල පවරා ගැනීමේ යෝජනාවක් සෙනසුරාද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. සෙනසුරාද පාර්ලිමේන්තුව තියෙන බව ජනාධිපතිවරයා ප්‍රංශයට ගිය වේලාවේ මාධ්‍ය සාකච්ඡාවකින් කිව්වේ. සාමාන්‍ය සම්ප්‍රදායට එහා ගිහින් හදිසි කටයුත්තකට සැරසෙනවා වාගේ ලෝකයට පෙන්වලා පාර්ලිමේන්තුව කැඳෙව්වා.

ණය ප්‍රතිව්‍යූහගතකරණය ගැන යෝජනාවක් ගෙනැල්ලා ඒක ගැන විවාදයක් පවත්වනවා කියන එකයි මුලින්ම ආණ්ඩුව සමාජයට කිව්වේ. ආණ්ඩුව ලහි ලහියේ පාර්ලිමේන්තුව රැස් කළේ පාර්ලිමේන්තුවේ මූල්‍යමය බලය ගැන සීමාවකින් තොරව තීන්දු තීරණ ගන්න ජනාධිපතිතුමාට අවසර දීමටයි. පොදුජන පෙරමුණේ අය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළේ ඒ වෙනුවෙන්. මෙතරම් හදිසියේ සෙනසුරාද දවසකයි පාර්ලිමේන්තුව රැස් කළේ. 4 වැනිදයි රැස්වෙන්න තියෙන්නේ. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුව රැස් කරන්න කෝටියකට වඩා මුදල් වැය කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ සේවක සේවිකාවන් 2000කට ආසන්න පිරිසක් ඉන්නවා. මේ අය හැමෝම එන්න ඕන. සෙනසුරාද කියන්නේ ඒ අයට අතිරේක දීමනාවක් ගෙවන්න ඕනෑ. අපේ රට බංකොලොත් කියනවා. ලෝකෙ වටේටම යනවා හිඟාකකා ණය ගන්න. ජනතාවට පටි තදකරගන්න කියලා මේ අය සෙනසුරාදට පාර්ලිමේන්තුව රැස් කරනවා. ඒක අඟහරුවාදම යෝජනාව සම්මත කරගන්න පුළුවන්නේ. ඇයි මේ තරම් හදිසි.

රටේ විධායක ජනාධිපති හැටියට එතුමාට විධායක බලතල තියෙනවා. පාර්ලිමේන්තුවට තියෙනවා ව්‍යවස්ථාදායක බලතල. මුදල් බලයත් එයටයි හිමිවෙලා තියෙන්නේ. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව නියෝජනය කරන්නෙ නැති කෙනෙක්. මුදල් ඇමැතිවරයා ලෙස එතුමා බලය ලබාගෙන පාර්ලිමේන්තුවේ මූල්‍ය බලයත් එතුමා ලබාගත්තා. එතකොට පාර්ලිමේන්තුවේ බලය නිශේධ වෙනවා. දැන් පාර්ලිමේන්තුවක් වැඩක් නෑනේ."

## රාගම රෝහලේදී

# කාන්තාවක මියගියේ එන්නත් ගැටලුවක් නිසා බවට සැකයි



- රවි කුමුදේශ්

**රාගම රෝහලේදී පසුගිය සතියේ කාන්තාවක් මිය යෑමට හේතුව ඇයට ලබා දුන් ප්‍රතිජීවක එන්නතෙහි ගැටලුවක් නිසා ඇතිවූ ආසාත්මිකතාවක් නිසාදැයි බරපතළ සැකයක් මතු වී ඇති බව සෞඛ්‍ය වෘත්තියවේදීන්ගේ විද්වත් සංගමයේ සභාපති රවි කුමුදේශ් පවසයි.**

ඇමොක්සිග්ලොව් නමැති මෙම ඖෂධය ලබා දුන් රෝගීන්ට මීට පෙරද බරපතළ අසාත්මිකතා ඇතිවී පැමිණිලි ලැබී ඇති බවත් ඒවා සාමාන්‍ය අසාත්මිකතාවන් සේ සලකා එම පැමිණිලි බැහැර කර ඇති බවත් ඔහු අවධාරණය කරයි. මේ පිළිබඳව විධිමත් සායනික විමර්ශනයක් සිදු කරන ලෙස සෞඛ්‍ය වෘත්තියවේදීන්ගේ විද්වත් සංගමය සෞඛ්‍ය ඇමැතිවරයාගෙන් ඉල්ලා සිටියි.

මෙලෙස මිය ගොස් ඇත්තේ ජා ඇල, උතුරු බටගම පදිංචිව සිටි එක් දරු මවකි. විෂබීජයක් ශරීරගත වීම නිසා ඇයට ලබා දුන් එන්නතක් හේතුවෙන් ඇති වූ අසාත්මිකතාවක් නිසා ඇය මිය ගොස් ඇති බව මරණ පරීක්ෂණය මගින් තහවුරු වී ඇති බව වාර්තා වෙයි. තත්ත්වයෙන් බාල ඖෂධ හේතුවෙන් රෝගීන්ට සිදුවන හානි සහ ජීවිත හානි වැඩිවෙමින් පවතින බවත් ඒවා බොහොමයක් සාමාන්‍ය තත්ත්වයන් ලෙස යට ගැසීමේ හෝ නොසලා හැරීමේ තත්වයක් පවතින බවද රවි කුමුදේශ් පවසයි. මෙය බරපතළ තත්ත්වයක් බවත් මහජනතාවගේ එවන් පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ස්වාධීන කමිටුවක් වහාම පත් කරන ලෙසත් සෞඛ්‍ය වෘත්තියවේදීන්ගේ විද්වත් සංගමය වැඩිදුරටත් පවසයි.

## ලියාපදිංචි නැති

# සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන සැප්. 15ට පෙර ලියාපදිංචි විය යුතුයි

■ වරුණි පෙරමුණ

ලියාපදිංචි නොකළ සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලබන සැප්තැම්බර් මස පහළොස්වැනිදට (15වැනිද) පෙර සෞඛ්‍ය අමාත්‍යංශයේ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි වියයුතු බවට එම නියාමන සභාව දැනුම් දීමක් කරයි.

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය පිළිබඳ පනතෙහි නියමයන් ප්‍රකාරව මෙරට සියලු පෞද්ගලික වෛද්‍ය ආයතන සෞඛ්‍ය අමාත්‍යංශයට අයත් පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි කළ යුතුය.

අදාළ ලියාපදිංචි කිරීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත ලිපියක් යොමුකරමින් සිදුකළ හැකිය.එසේ ලියාපදිංචිය සිදුනොකරන සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතනවලට එරෙහිව ලබන ඔක්තෝබර් මස පළමුවැනිද (01 වැනිද) නඩු පැවරීමට කටයුතු කරන බවද එම නියාමන සභාව දැනුම් දෙයි. ගතවූ මාස හතරක පමණ කාලය තුළ ලියාපදිංචි කර නොතිබූ පෞද්ගලික රෝහල් සහ වෛද්‍ය ආයතන එක්දහස් පන්සියයක් (1500) පමණ සෞඛ්‍ය අමාත්‍යංශයේ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ ලියාපදිංචි වී තිබේ. එසේ ලියාපදිංචි වුවද තවත් ලියාපදිංචි නොවූ වෛද්‍ය ආයතන දසදහසක පමණ ප්‍රමාණයක් මෙරට පවතින බව වාර්තා වෙයි.

# ග්‍රහචාරය

2023 ජූලි මස 03 වැනි සඳුදා

රාහු කාලය
උදේ 7.32 - උදේ 9.07
රාත්‍රි 7.56 - රාත්‍රි 9.22

ශුභ දිසාව - නැගෙනහිර
මරු සිටින දිසාව - වයඹ

## මේෂ
**තර්කානුකූලව වැඩ**
මෙතෙක් පැවැති ආවේග සිතුවිලි ස්වභාවයන් ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීම් ඇතිවේ. වඩාත් තර්කානුකූලව වැඩ කිරීමට උනන්දුවක් දක්වනු ඇත.

## වෘෂභ
**ජල අනතුරු**
වේගවත් හෝ ඉක්මන් සිතිවිලි ඇති වුවත් එය පාලනය කරගත යුතුවේ. රැකියාවේ කටයුතු සම්බන්ධව විශේෂයි. ජලය හා සම්බන්ධ කටයුතු කරදරකාරී වීමට ඉඩ තිබේ.

## මිථුන
**බාධක අඩුවේ**
තම දැනුම හා හැකියාවන් සම්බන්ධයෙන් මෙතෙක් තිබූ බාධකයන්ගේ ක්‍රමික අඩුවීමක් ඇති වේ. අන්‍යයන්ගේ අවධානය වඩාත් තහවුරු වේ. සවස් කාලය සිතට කරදර ඇති කළ හැකිය.

## කටක
**සවස යහපත්**
සවස් කාලය වඩාත් යහපත් බවක් ගෙන දෙනු ඇත. පොදු, අන්‍යයන් හා ඉක්මන් ක්‍රියාකාරකම් වෙනුවෙන් උනන්දු වනු ඇත. ආශාව හැඟීම් මනාව පාලනය කර ගත යුතු වේ.

## සිංහ
**ස්වයං තීරණ**
ස්වයං තීරණ ගැනීමට බොහෝ දුරට ඉඩ ලැබේ. ඉන් වාසි ද අත්වනු ඇත. ආගමික කටයුතුවලට සම්බන්ධවීම් ඇති වේ. එහෙත් අන්‍යයන් හා එක්ව වැඩ කිරීමේ දී වඩාත් ආරක්ෂාකාරී වන්න.

## කන්‍යා
**ශාස්ත්‍රිය කටයුතු**
ශාස්ත්‍රිය කටයුතුවලින් ලාභ අපේක්ෂිත මෙන්ම තෘප්තියද ලැබෙනු ඇත. එහෙත් මිල මුදල් ගනුදෙනු සම්බන්ධව වඩාත් සැලකිලිමත් වන්න. අත්හැරීම්, අලාභවලට ඉඩ ඇති කළ හැකි බැවිනි.

## තුලා
**තමන්ගේ තීරණ**
සවස් කාලය වඩාත් වාසිදයකයි. තමාගේම අදහස් අනුව තීරණ ගැනීමට ඉඩ ලැබේ. ප්‍රසිද්ධ කටයුතුවලදී මැදිහත්වීම් ඇතත් එහි ව්‍යාකූලතාවක් සම්බන්ධව කල්පනාකාරී වන්න.

## වෘශ්චික
**කාර්යබහුලයි**
වඩාත් කාර්යබහුල බවක් ගෙන දෙනු ඇත. එහෙත් සිතිවිලි පැටලිලි ස්වභාවන් ඊට බාධක අත්කර දිය හැකිය. උදේ කාලය සාමාන්‍යයෙන් යහපත්ය. සුහද හා බුද්ධිමත් කතා බහකට ඉඩ සැලසේ.

## ධනු
**විවාහ බාධා**
උදේ කාලය අධ්‍යාපන කටයුතු සම්බන්ධව නිදහස් වටපිටාවක් ඇතිවේ. අන්‍යයන් හා කතාබහ සහයෝගිමත්ව සිදු වේ. එහෙත් තීරණ හෝ එකඟවීම් කෙරේ බාධක ඇතිවේ. විවාහ කතා බහ විශේෂයි.

## මකර
**පැටලිලි ගති**
එදිනෙද වැඩ කටයුතු පිළිබඳ කතාබහ ගැන සැලකිලිමත් වන්න. පැටලිලි ගති අවාසි ගෙනෙන බැවිනි. සවස් කාලය අන්‍යයන් හා සුහදව වැඩ කිරීමට හැකියාවන් ගෙන දේ.

## කුම්භ
**විරෝධතාවන්ට ලක්වේ**
තම අභිප්‍රායයන් කෙරේම එල්බව තීරණ ගැනීම කරදර ගෙන දෙනසුළු වේ. අන්‍යයන්ගේ විරෝධතාවන්ට ලක්වේ. සවස් කාලය විශේෂයෙන් සැලකිලිමත් වන්න. මිල මුදල් පරිහරණය දුර්වලතා ගෙන දිය හැකිය.

## මීන
**සෘජු තීරණ**
මිල මුදල් සම්බන්ධව වාසිදයක අයුරින් කතා බහට ගැළපේ. අන්‍යයන්ට දී ඇති මුදල් ලබා ගැනීම සම්බන්ධව කතා කර ගැනීමට උදේ කාලය වඩාත් ගැළපෙනු ඇත. සෘජු තීරණ ගැනීමට බොහෝ දුරට ඉඩ ලැබේ.

# බොරැල්ලේ ගෙදරට වෙඩි තැබිල්ල අයිතිකාරයාගේම වැඩක්

## පොලිසියේ දී හෙළිවෙලා

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

ප්‍රසිද්ධ සමාගමක ප්‍රධානියකුගේ බොරැල්ලේ පිහිටි නිවසේ ගේට්ටුවට වෙඩි තැබීමේ සිද්ධිය රුපියල් ලක්ෂ 10 ක කොන්ත්‍රාත්තුවක්දී පැමිණිලිකරු විසින්ම සැලසුම් සහගතව සිදු කළ ක්‍රියාවක් බවට අනාවරණය වීමෙන් අනතුරුව එම ප්‍රධානියා ඇතුළු පුද්ගලයන් සිවුදෙනකු අත්අඩංගුවට ගත් බව කොළඹ දකුණු අපරාධ කොට්ඨාසය කියයි.

අත්අඩංගුවට පත් වූවන් අතර විනය විරෝධී ක්‍රියා වලට සම්බන්ධ හමුද සෙබලෙක් , සමාගම් ප්‍රධානියා සහ ඔහුගේ රියැදුරන් දෙදෙනකු ද වන බව පොලිසිය කියයි.

වෙඩි තැබීමට යොදා ගත් ටී 56 ගිනි අවියක් මැගසින් 2 ක් සහ ජීව උණ්ඩ 64 ක් පොලිස් භාරයට ගෙන ඇත.

ඉකුත් මස 22 වැනි දින උදෑසන 5.30 ත් 6.00 ත් අතර වේලාවේදී යම් පිරිසක් නිවස ඉදිරිපිට ගේට්ටුවට වෙඩි තබා ඇති බවට සැකකාර ආයතන ප්‍රධානියා බොරැල්ල පොලිසියට කරන ලද පැමිණිල්ලක් අනුව කළ මූලික විමර්ශනවල දී අනාවරණය වූ සියලුම තොරතුරු කොළඹ දකුණ අපරාධ කොට්ඨාසය වෙත ලබාදීමෙන් අනතුරුව සමාගම් ප්‍රධානියා අත්අඩංගුවට ගෙන සිදු කළ ප්‍රශ්න කිරීමේදී සියලුම තතු අනාවරණය කර ගැනීමට පොලිසියට හැකි වී තිබිණි.

එහිදී පැමිණි සැකකරුවන් ටී 56 ගිනි අවියකින් වෙඩි ප්‍රහාර දෙකක් ගේට්ටුවට එල්ල කර තිබූ බවත් එමගින් කිසිවකුට ජීවිත හානි හෝ දේපළ හානියක් සිදුවී නොමැති බවටත් අනාවරණය විය




කොළඹ දකුණු කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී හසන්ත මාරපන ටී 56 ගිනි අවිය පරීක්ෂාකරමින්.



සැකකාර හමුදා සෙබළා වෙඩි තැබීමෙන් අනතුරුව ගමන් කරන අයුරු සීසීටීවී කැමරාවක සටහන්ව තිබුණේ මෙසේය.

සැකකාර සමාගම් ප්‍රධානියා තනතුර දරන සමාගම ඥාති සහෝදරයන් කිහිපදෙනෙකු අතර පාලනය වන අතර පැමිණිලිකරු විසින් යෝජිත විශේෂ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් විශේෂ රැස්වීමක් එදිනම සවස පැවැත්වීමට නියමිතව තිබී ඇත. ඊට යම් බලපෑමක් එල්ල කිරීම සඳහා මෙම වෙඩි තැබීම සැලසුම් සහගතව සැකකරු විසින් සිදුකර ඇති බව පොලිසිය කියයි.

ඒ සඳහා සැකකරු ඔහුගේ රියැදුරන් දෙදෙනාගේ සහාය ලබාගෙන හිටපු හමුද සෙබළා ලවා මෙම වෙඩි තැබීම සිදු කර ඇති බව ද කියයි.

සැකකරු පොරොන්දු වූ රුපියල් ලක්ෂ 10ක මුදලින් මේ වන විට රුපියල් 9 ලක්ෂ 50000 ක මුදලක් හමුද සෙබළා සහ රියැදුරන් දෙදෙනා වෙත ලබාදී තිබූ බව ද අනාවරණය වී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සිව්දෙනා අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

බොරැල්ල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජානක ප්‍රියදර්ශන විතානගේ ,කොළඹ දකුණු කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අජිත් කුමාර යන අය ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ පවත්වති.



අත්අඩංගුවට පත් පුජා භාණ්ඩ හා කැනීම් උපකරණ පොලිස් පරීක්ෂාවට ලක්වූ අයුරු

# කරමල කළු කුකුළකු බිල්ලට දී

## වළගම්බා රජුගේ රන් ඔටුන්න ගන්න යද්දී අහුවෙයි



බිලි දීම සඳහා සූදානම්කර සිටි කළු කුකුළා

■ කේ .කේ . ආරියදාස - දඹුල්ල

කරමල කළු කුකුළකු බිල්ලට දී මැණික් එබ්බ වූ බව කියන වළගම්බා රජුගේ රන් ඔටුන්නක් ගන්න ගිය හයදෙනකු අත්අඩංගුවට ගෙන තිබේ.

මැණික් එබ්බවූ වලළගම්බා රජුගේ රන් ඔටුන්නක් සහ මැණික් කුල්ලක් ඇති බව පවසමින් එය ලබා ගැනීම් සඳහා කැණීම් කරමින් සිටි පුද්ගලයන් හයදෙනකු දඹුල්ල කපුවත්ත මොරගොල්ල වත්ත ඉඩමකදී මෙසේ සැකපිට අත්අඩංගුවට ගත් බව දඹුල්ල පොලීසිය කියයි.

අත්අඩංගුවට ගෙන ඇත්තේ මහනුවර පූජාපිටිජාපිටිය ප්‍රදේශයේ සහ මහියංගණය ප්‍රදේශයේ පදිංචිකරුවන්ය.

පූජාපිටියේ ව්‍යාපාරිකයකුට අයත් මෙම ඉඩම දඹුලු රජමහා විහාරස්ථානයට කිලෝමීටර් කීපයක් දුරකින් පිහිටා තිබේ. ඉතා සූක්ෂම ලෙස වසර ගණනාවක සිට මෙම නිධන් ලබාගැනීම සඳහා සැලසුම් කොට ඇති බව පොලීසිය කියයි.

කෙසේවෙතත් එම ස්ථානයේ වළක් හාරා නිධානය ලබා ගැනීම් සඳහා දුර්ලබ කළු කුකුලා බිලි දී ගල් පියනක් ඉවත් කිරීමට සිටිය දී පොලිසියට ලද තොරතුරක් මත පිරිස අල්ලාගත් බව කියයි.

මෙම නිධානය ලබාගැනීමගැනීම සඳහා මහ පොළොව කැණීම ට යොදා ගත් ආයුධ රැසක් මෙන්ම පූජා භාණ්ඩ රැසක් ද පොලිසිය සොයාගෙන තිබේ

දඹුල්ල විශේෂ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ප්‍රියශාන්ත බණ්ඩාර සහ දඹුල්ල පොලීසියේ විවිධ පැමිණිලි අංශයේ ස්ථාන ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඒ .ජී .ආර්. ඇල්ලේපොල ඇතුළු පොලිස් කණ්ඩායමක් එම ස්ථානයට යන විට මෙම ඉඩමේ හිමිකරුවන් බව කියන පිරිසක් ද පැමිණ තිබූ බව පොලිසිය කියයි.

ඉඩමේ හිමිකරුවන් පොලිසියට ප්‍රකකොට ඇත්තේ තමන්ගේ කිසිදු අනු දැනුමකින් තොරව පිටස්තර කණ්ඩායමක් මෙම කටයුත්ත සිදු කර ඇති බවට තමන් සැක කරන බව ය.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දඹුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

# අපි ආවේ මත්කුඩු හොයන්න රන් බඩු තියෙනවා නම් අයින් කරගන්න

## සීඅයිඩී වෙස්ගත් කොල්ල කල්ලිය බලෙන්ම ගෙට පැනලා

■ බණ්ඩාරගම - බිමල් ජයසිංහ

ලී මෝලක් හිමි කහතුඩුව ව්‍යාපාරිකයකුගේ නිවසට අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් යැයි කියා ගත් පුග්දලයින් තිදෙනෙකු කඩා වැදී ව්‍යාපාරිකයාගේ බිරිඳට සහ පුතුට පහරදී රුපියල් ලක්ෂ 20කට ආසන්න වටිනා රන් භාණ්ඩ තොගයක් කොල්ලකා පලා ගොස් ඇත.

කොල්ල කන ලද දේපළ අතර රන් මාල, මුදු, පෙන්ඩන්ට් හා ජංගම දුරකථනයක් ද වන අතර කොල්ලය සිදුවන අවස්ථාවේ දී ව්‍යාපාරිකයා නිවසින් බැහැරව සිට ඇති බව කහතුඩුව පොලිසිය සඳහන් කරයි.

නිවසේ පිටුපස දෙර අසලට පැමිණ තිබූ කොල්ලකරුවන් "අපි ආවේ මත්කුඩු හොයන්න ඔයාලගේ රන් භාණ්ඩ තියෙනවා නම් අයින් කරගන්න" යැයි පැවසීමත් සමඟම ව්‍යාපාරික බිරිඳ ඔවුන් අමතා "පොලිස් හැඳුනුම්පත දෙන්න" යැයි පැවසීමෙන් ඇයට එක් කොල්ලකරුවකු මුහුණට පහරදී නිවසට ඇතුළු වී තිබේ.

කොල්ලකරුවන් නිවසට ඇතුළු වී මද වේලාවක දී ව්‍යාපාරිකයාගේ වැඩිමහල් පුතු ජංගම දුරකථනය රැගෙන නාන කාමරයට ගොස් සිය පියාට කතා කිරීමට උත්සාහ කිරීමේ දී එහි දෙර කඩා ඔහුට ද කොල්ලකරුවෙක් පහර දී ජංගම දුරකථනය ද පැහැර ගෙන තිබේ. විනාඩි 15ක පහළොවක පමණ කාලයක් කොල්ලකරුවන් නිවස තුළ රැඳී සිට ඇත.

මේ ආකාරයෙන්ම පසුගිය 29 වැනිදා කොල්ලකරුවන් පොලිස් වෙසින් පැමිණ මිල්ලනිය කැන්නන්තුඩාව ප්‍රදේශයේ පොලියට මුදල් ලබා දෙන පුද්ගලයකුගේ රුපියල් ලක්ෂ 25කට ආසන්න රන් භාණ්ඩ තොගයක් ද රැගෙන ගොස් තිබිණි.

# එකට කකා බිබී හිටිය මිතුරා මරා පුළුස්සා සිරුරු කොටස් මුතුරාජවෙල හංගලා



ඝාතනයට ලක්ව ඇති මධුශාන් පෙරේරා

■ ටී.කේ.බර්නාඩ්-.ජාඇල, ප්‍රසංග පාවුලුහේවා-කටුනායක

පුද්ගලයකු තියුණු ආයුධයකින් කපා කොටා ඝාතනය කොට සිරුර පුළුස්සා ඉතුරුවූ සිරුරු කොටස් මුතුරාජවෙල රක්ෂිතයේ වගුරු බිමක සැඟවූ බව කියන සැකකරුවකු පමුණුගම ප්‍රදේශයේදි අත්අඩංගුවට ගත් බව පමුනුගම පොලිසිය පවසයි. ඝාතනයට ලක්ව පුළුස්සා දමා ඇති සිරුර ජාඇල තුඩැල්ල පදිංචිව සිටි 34 හැවිරිදි කේ.මදුශාන්රංග පෙරේරා නමැති දෙදරු පියකුගේ බවට හඳුනා ගෙන ඇත.

සිද්ධිය සම්බන්ධයෙන් මෙසේ සැකපිට අත්අඩංගුවට ගෙන ඇත්තේ ජාඇල නිල්සිරිගම පදිංචි 42 හැවිරිදි රොමේශ් ලක්මුතු කුමාර පෙරේරා නමැති විවාහකයෙකි.

මියගොස් ඇති අය සහ සැකකරු හොඳ යහළුවන් ලෙස ඉතා ළඟින් ඇසුරු කර ඇත.

ඉකුත් 19 වැනි දින සැකකරුගේ ගෙදරදී දෙදනා එක්ව සිංදු කියමින් පදමට මත්පැන් පානය කරමින් සිටි අතර දෙදෙනා අතර පරණ කෝන්තරයක් මතු වී එය දුරදිග යාමෙන් සැකකරු අතින් මෙම ඝාතනය සිදුව ඇති බව අනාවරණය වී ඇත.









# ඉන්දු ලංකා බෝට්ටු සේවාවට බාලගිරි දෝෂය

■ වරුණී පෙරමුණ

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මගී බෝට්ටු සේවය ඇරඹීම ප්‍රමාද වන බව ඉන්දීය මාධ්‍ය වාර්තා කර තිබේ.

නවදිල්ලි නුවර සිට බෝට්ටු සේවය ආරම්භ කිරීම සඳහා තෝරාගෙන තිබූ වරාය වෙනස් කිරීම මෙම ප්‍රමාදයට හේතුවී ඇතැයි ද එරට මාධ්‍ය සඳහන් කරයි.

පසුගිය 29 වැනිද ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර මෙම මගී බෝට්ටු සේවාව ඇරඹීමට නියමිතව තිබිණි.

තමිල්නාඩුවේ, නාගපට්නම් වරායේ පහසුකම් වැඩි කිරීම සඳහා ඉන්දියාව තවත් දින කිහිපයක් ඉල්ලා සිටීම හේතුවෙන් මෙම මගී බෝට්ටු සේවාව ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කිරීමට සිදු වන බව වරාය ඇමැති නිමල් සිරිපාල ද සිල්වා ඉන්දීය මාධ්‍ය වෙත පවසා තිබේ.

# භූගත දුරකථන රැහැන් කපා විකුණන ජාවාරමක්

## රැහැන් තොගයක් සමග අයෙක් කොටු

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

මෙරට ප්‍රධාන පෙළේ දුරකථන සමාගමකට අයත් භූගත යකඩ කුටීරවල තැන්පත් කර ඇති දුරකථන රැහැන් කපා විකිණීමේ ජාවාරමක නිරත වූ සංවිධානාත්මක කල්ලියක සාමාජිකයකු මොරන්තුඩුව, කන්දකඩේ ප්‍රදේශයේදී මොරන්තුඩුව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී විකිණීමට රැගෙන යමින් සිටි අඩි 650ක් පමණ දිග භූගත රැහැන් තොගයක්, ඒවායෙහි දෙපස සම්බන්ධීකරණය කරන අඩි හතරක් පමණ දිගැති සයිලන්සරයක හැඩයෙන් යුත් යකඩ බඹ්බු දෙකක්, රැහැන් කැපීමට යොද ගත් විශාල අඬුවක්, ඇදීමට යොදගත් කඹයක් සහ තවත් උපකරණ රැසක් සමග ඒවා ප්‍රවාහනයට යොදගත් ලොරියද පොලිස් භාරයට ගෙන තිබේ.

මීට දින කිහිපයකට ඉහතදී ද මෙම සැකකරු තවත් පුද්ගලයන් සිවුදෙනකු සමග මොරන්තුඩුව, මාවල ප්‍රදේශයේදී මෙලෙසම භූගත රැහැන් කපා ඇතැයි අනාවරණය වූ බව පොලිසිය කීවේය. මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

අදළ දුරකථන සමාගම විසින් මාර්ගය ආශ්‍රිතව සකසා තිබූ යකඩ කුටීර විවෘත කර අඬුවක් ආධාරයෙන් එක් කොණක රැහැන් කපා, කඹයකින් ගැට ගසා ලොරිය ආධාරයෙන් ඉදිරියට ඇද භූගත රැහැන් එකතු කරගත් බව වැඩිදුර ප්‍රශ්න කිරීමේදී සැකකරු බවසා ඇත.

මෙම භූගත දුරකථන රැහැන් කැපීම සඳහා පැමිණි අනෙක් පිරිස අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ පොලිස් කණ්ඩායමක් යොදවා ඇති අතර, ඉකුත් කාලය පුරා විවිධ ප්‍රදේශවල මෙලෙස භූගත රැහැන් කැපූ සංවිධානාත්මක කල්ලිය මෙය දැයි සෙවීමට වැඩිදුරටත් විමර්ශන පවත්වන බව උසස් පොලිස් නිලධාරියෙක් පැවැසීය.

අදළ දුරකතන සමාගමේ බණ්ඩාරගම ශාඛාවේ ඉංජිනේරුවරයකු මෙම සොරකම සම්බන්ධයෙන් පැමිණිල්ලක් සිදුකර ඇත.

මෙම සැකකරුවන් විසින් කපා දමා ඇත්තේ ග්‍රහකයන් තුන්සියකට සන්නිවේදන පහසුකම් සලසාදීමට යොද තිබූ රැහැන් බවත් එහි වටිනාකම මෙතෙක් තක්සේරු කර නැති බවත් පොලිසිය සඳහන් කළේය.

## සියමට යන්න පෙර

# මුතුරාජාට මාසයක ගුවන් ගමන් පුහුණුවක්

## අමුතු ගුවන් ගමනට කලින් පිරිතුත් අහලා


මුතු රාජා ඇතා


ඇතා ප්‍රවාහනය කළ රථය

## තායි ඇතා වසර 22කට පසු යළි මවුරටට

■ අනීෂා මානගේ/ ටී.කේ.ජී. කපිල - කටුනායක
ජේ.පී.ඥානතිස්ස - බොරලැස්ගමුව

මෙරට සත්ත්වලෝලීන්ගේ නොමඳ ආදරය දිනූ 'මුතුරාජා' ඇතා සිය මවු රට වන තායිලන්තය බලා යාමේ අරමුණින් ඊයේ (2 වැනිද) පෙරවරුවේ කටුනායක ගුවන්තො වෙත රැගෙනවිත් තිබිණි. අනතුරුව රුසියානු භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානයක් වන 'ඉලූෂියන් - 76' යානය එම ඇතා රැගෙන පෙරවරු 7.30ට කටුනායක ගුවන්තොටුපළින් ගමන් ඇරඹීය.

මෙරට දිගම දළ යුගලය හිමි ඇතකු ලෙස නම් දරා සිටි 'මුතුරාජා' ඇතා මෙරටට හිමිව තිබුණේ 2001 වර්ෂයේ ජනවාරි 08 වැනිදය. ඒ වන විට හත් හැවිරිදි වියේ පසුවූ 'මුතුරාජා' මෙරටට ලැබුණේ තායිලන්ත රජයේ පරිත්‍යාගයක් ලෙසිනි. කලක් තිස්සේ අලුත්ගම කන්දේ විහාරයේ ජීවත් වූ 'මුතුරාජා'ට විඳින්නට වූ හිරිහැර හේතුවෙන් පසුගිය වසරේ නොවැම්බර් 9 වැනිද සිට එම සත්ත්වයා දෙහිවල සත්වෝද්‍යානයට රැගෙන ආවේ එය තාවකාලික නවාතැන්පොළක් ලෙස යොදගෙනය. ඒ වන විට මුතුරාජාගේ සුවිසල් ශරීරයේ තිබූ තුවාල, පාදයේ ආබාධය, ඇසෙහි සුද ආදියට කඩිනමින් ප්‍රතිකාර කිරීම අත්‍යවශ්‍ය වී තිබිණි. එහෙත් ඒ සියල්ල වෙනුවෙන් පශු වෛද්‍ය පහසුකම් ශ්‍රී ලංකාවේ නොතිබිණි. 'මුතුරාජා' උපන් රට වන තායිලන්තය අදළ ප්‍රතිකාර කටයුතු උදෙසා සත්ත්වයා එරටට රැගෙන යාමට තීරණය කර තිබුණේ එබැවිනි.

'මුතුරාජා' තායිලන්තයට රැගෙන යාමට නියමිතව තිබූ ඊයේ (2 වැනිද) වනතුරු 'මුතුරාජා'ගේ සියලුම වැඩ පැවරී තිබුණේ දෙහිවල සත්වෝද්‍යානයටය. දෙහිවල සත්වෝද්‍යානයේ පශු වෛද්‍ය මදූෂා පෙරේරා ඇතුළු සත්වෝද්‍යාන සේවකයෝ 'මුතුරාජා' වෙනුවෙන් සිය උපරිමය ඉටු කළහ. 'මුතුරාජා'ගේ සෞඛ්‍ය තත්ත්වය සියයට අනූවකටත් වඩා සුව අතට හැරවී තිබුණේ ඔවුන්ගේ එම මහන්සියට උපරිම සාධාරණය ඉටු කරමිනි.

'මුතුරාජා' මවු රටට රැගෙන යාම වෙනුවෙන් සියලුම කටයුතු තායිලන්ත රජයෙන් සූදනම් කෙරිණි. කිලෝග්‍රෑම් හාරදහසක් පමණ බරින් යුතු 'මුතුරාජා' වෙනුවෙන් කිලෝග්‍රෑම් පන්දහසක පමණ බරින් යුතු අඩි එකොළහක් පමණ උසැති කූඩුවක් ද සකස් කෙරිණි.

තායිලන්ත ඇත්ගොව්වන් පිරිසක් ඉකුත් ජූනි මාසයේදී මෙරටට පැමිණ තිබුණේ 'මුතුරාජා' එරටට රැගෙන යාමට පුරුදු පුහුණු කරවීම උදෙසාය. පුරා මාසයකට ආසන්න කාලයක් තිස්සේ 'මුතුරාජා' එලෙස පුහුණු කෙරුණේ මවු රට බලා ගුවනින් යන ගමනටය.

'මුතුරාජා' මෙරටින් රැගෙන යාමට පෙර ඔහු වෙනුවෙන් පිරිත් කියන්නට අලුත්ගම කන්දේ විහාරයේ භික්ෂූන් වහන්සේලා කිහිපනමක් ද ඉකුත් 30 වැනිද දෙහිවල සත්වෝද්‍යානයට වැඩම කළහ.

මාස නවයකට ආසන්න කාලයක් දෙහිවල සත්වෝද්‍යානයේ ආරක්ෂිතව සිටි 'මුතුරාජා' පෙරේද (01) මධ්‍යම රාත්‍රියේ දෙහිවල සත්වෝද්‍යානයේ සිට කටුනායක බලා රැගෙන විත් තිබේ.

අන් කිසිවක් ගැන නොසිතූ සිය ගණන් සත්ත්වලෝලීන් දෙහිවල සත්වෝද්‍යානය ඉදිරිපිට රැස්ව සිටියේ අවසන් වරට 'මුතුරාජා' ඇතා දැකබලාගැනීමේ අරමුණෙනි. 'මුතුරාජා' දෙහිවල සත්ත්වෝද්‍යානයෙන් නික්ම යන ආකාරය සියලුදෙනාට දැක බලාගැනීම උදෙසා සත්ත්වෝද්‍යානයේ නිල ෆේස්බුක් පිටුවෙන් සජීවී රූපරාමු පෙළක් ද ලබා දී තිබිණි.

තමා වෙනුවෙන්ම සැකසූ කූඩුවට නැගි 'මුතුරාජා' විශාල ප්‍රමාණයේ රථයකින් කටුනායක ගුවන්තොටුපළ වෙතට රැගෙන ගියේ ඊයේ (02) අලුයම 3.00ට පමණය. එම රථය 'මුතුරාජා'ට අපහසුවක් නොවන ආකාරයට ඉතාමත් සෙමින් ගුවන්තොටුපළ දක්වා ගමන් කෙරිණි.

අනතුරුව 'මුතුරාජා' රැගත් රුසියානු භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානයක් වන ඉලූෂියන් - 76 යානය ඊයේ (02 වැනිද) පෙරවරු 7.30ට පමණ තායිලන්තයේ බැංකොක් නුවර මිෂන්මායි ගුවන්තොටුපළ දක්වා ගමන් ඇරඹුවේ 'මුතුරාජා'ට ආදරය කළ දහස් ගණනකගේ දෙනෙත් කඳුළින් තෙත් කරමිනි.

# තානාපතිවරු 50ක් 'වයිස්රොයි' කෝච්චියෙන් කොටුවෙන් ඇල්ලට


තානාපතිවරුන්ගෙන් කොටසක්.....

■ සිතාර ඉරාෂ් - වටවල

මෙරට සිටින තානාපතිවරු 50 දෙනෙක් කොළඹ කොටුවේ සිට ඇල්ල දුම්රිය ස්ථානය දක්වා 'වයිස්රොයි' විශේෂ දුම්රියෙන් පෙරේදා (01 වැනිදා) සංචාරය නිරත වූහ.

තානාපතිවරුන් රැගත් එම විශේෂ දුම්රිය පෙරේදා (01 වැනිදා) නානුඔය දුම්රිය ස්ථානයේ ගාල් කර තබා, ඔවුහු එදින නුවරඑළියේ විවේක ගත්හ. යළි එම පිරිස රැගත් දුම්රිය ඊයේ (02 වැනිදා) උදෑසන නානුඔය දුම්රිය ස්ථානයේ සිට ඇල්ල දුම්රිය ස්ථානය දක්වා ආරම්භ කෙරිණි.

මෙම සංචාරයට ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක ද එක්ව සිටියේය. මෙරට සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරක මණ්ඩලය හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව මෙම සංචාරය සංවිධානය කර ඇත.

එම විශේෂ දුම්රිය ධාවනය වූ උඩරට දුම්රිය මාර්ගයේ සෑම දුම්රිය ස්ථානයකම සහ දුම්රිය මාර්ගය දෙපස ද දැඩි පොලිස් ආරක්ෂාවක් යොදා තිබිණි.



## ජාතියක් ලෙස ඉදිරියට යන්න

# අපේ රටට සමාජ පරිවර්තනයක් ඕනෑ

### - මැල්කම් කාදිනල් රංජිත් හිමි



කාදිනල් හිමි ඇතුළු පිරිස.....

■ දර්ශාන් කානිල් - මොරටුව

සමාජ පරිවර්තනයක් රටට අවශ්‍ය බව මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.

උන්වහන්සේ මේ බව සඳහන් කළේ ඉකුත්ද පැවැති කොළඹ සාන්ත පීතර විද්‍යාලයීය ශතක සංවත්සරයට එක් වෙමිනි. එහිදී කාදිනල් හිමිපාණෝ මෙසේ ද පැවසූහ.

''අපි හැම තිස්සෙම දේශපාලන පක්ෂවලට සහ නායකයන්ට පහර දෙනවා. ඔවුන් මංකොල්ලකාරයෝ, හොරු කියලා කියනවා. හැබැයි ඡන්දයක් ආවම ගිහින් ඡන්දෙ දෙන්නෙ ඒ මිනිස්සුන්ටමයි. ඒ වගේම අවුරුදු 75ක් තිස්සේ හොරු රට මංකොල්ල කනවා. මිනිස්සු හිතන්නේ තමන් ගැන පමණයි. ඔවුන් අනෙක් අය ගැන නොසිතන නිසා අපේ සමාජයේ ප්‍රශ්න ගොඩනැගී තියෙනවා.

අපේ සමාජයේ ගොඩනැගුණු ප්‍රශ්නය වෙන කිසිවක් නොවෙයි. ඔබ සවිඥනයට විරුද්ධ දේවල් කරනවා. එවිට ඔබ කරන දේ සාධාරණීකරණය කිරීමට උත්සාහ කරනවා. ඔබ නීතිය හසුරුවන්න උත්සාහ කළා. එවැනි සමාජයක් අපි හදලා තියෙනවා. අපේ බොරුව සත්‍යය වී තිබෙනවා. අපි අවිනීතයි.

බලන්න ලංකාවේ වෙන දේ. ප්‍රශ්නය නායකත්වයක් නැති එකම නොවෙයි. බලන්න මිනිස්සු පාරේ වාහන එළවන විදිහ. ඔයාට යන්න තියෙන්නේ පාරට විතරයි, පාර අයිනේ ඇවිදින අය ඕනෑ තරම් ඉන්නවා. සමහර අය ඇවිත් එයාලව වට්ටනවා. සිහිකල්පනාවක් නැහැ, ශික්ෂණයක් නැහැ, පිළිවෙළක් නැහැ.

අපි කොහොමද මේ සමාජය පරිවර්තනය කරන්නේ? අපි සමාජය පරිවර්තනය කළ යුතුයි. අපේ ලස්සන, පුංචි රටට මොකද වෙන්නේ? අපේ නිවහන, හරිත ග්‍රහලෝකයේ හරිත රට මොනතරම් භයානක අවුලකද තියෙන්නේ? ඒ නිසා අපට සමාජ පරිවර්තනයක් අවශ්‍යයි. අපට අවශ්‍ය වන්නේ වැරදි දේ නොව නිවැරදි දේ ගොඩනගා ගැනීම සඳහා පරිවර්තනයක්. වැරදි හැසිරීම සාධාරණීකරණය කිරීම සඳහා නොවේ. මෙය අපට ඉතා වැදගත් වන අතර, එසේ නොවුවහොත් අපට ජාතියක් ලෙස ඉදිරියට යා නොහැකියි.''

## පේරාදෙණිය සරසවිය බලන්න ආ

# තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සිසුන්ට හන්තානේදී බඹර ප්‍රහාරයක්


තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සිසුන්

■ කමල් සුරවීර - මහනුවර
■ හේරත් ඒකනායක - රාජවැල්ල

පේරාදෙණිය විශ්වවිද්‍යාලය නැරඹීමට පැමිණ හන්තාන කන්ද තරණය කිරීමට ගිය ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සිසුන් 41 දෙනකු බඹර ප්‍රහාරයකට ලක්ව මහනුවර ජාතික රෝහලට ඇතුළත් කර තිබේ.

විවෘත දිනයක් ප්‍රකාශයට පත්කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය නැරඹීමට අවස්ථාව ලබා දී තිබූ පෙරේද (01 වැනිද) පෙරවරුවේ මෙම සිසුන් පිරිස බස් රථයකින් විශ්වවිද්‍යාලයට පැමිණ පස්වරු 4.00ට පමණ ගලහ ප්‍රදේශයෙන් හන්තාන කන්ද තරණය කිරීමට ගොස් ඇතැයි පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.

රෝහල් ගත කළ පිරිස අතර සිසුන් 28 දෙනකු සහ සිසුවියන් 13 දෙනකු සිටින බව මහනුවර පොලිසිය පැවසීය.

පොලිස් හදිසි ඇමතුම් අංශයට ලද පණිවුඩයකට අනුව සෝදිසි මෙහෙයුම් ආරම්භ කර යුද හමුදව සහ ප්‍රදේශවාසීන් එක්ව 'සුවසැරිය' ගිලන් රථ මගින් තුවාලකරුවන් මහනුවර ජාතික රෝහල වෙත රැගෙන ගොස් තිබේ.

මේ අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලය නැරඹීම සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සිසු සිසුවියන් 274 දෙනකු පමණ පැමිණ ඇතැයි පැවසේ.

සිද්ධිය සම්බන්ධයෙන් මහනුවර සහ පේරාදෙණිය පොලිසිය එක්ව පරීක්ෂණ සිදුකරයි.

